# යසෝදරා කථා වස්තුව



සම්පාදක

**පූජ්‍ය අකුරේගොඩ රතනසාර හිමි**

ලුම්බිණි සේනාසනය, කොස්වත්ත, බත්තරමුල්ල.

# අම්මාවරුනි

දිව රැය නිදි නොලැබ දරු පෙම දරා ගෙන
ලෙඩ වුණ විගස වෙද වරු පිරි වරා ගෙන
මගෙ දුක සැපම පැතු කඳුළැලි පෙරා ගෙන
අම්මේ ඔබයි ලොව සුරතුර මරා මිණ

නඩයේ ගුරා වී බුදු ගුණ සුවඳ දීදී
නොමගිය පිං කෙතක් සිරිලක නොමැත සැදී
රහසක් කියමි අම්මේ හද පතුලෙ බැදී
ඔබෙ ගුණ ගයන්නට මා ලද දූනුම මදී

අනුරාපුරය මහිංගන දඹුළු ලෙන
සමනල කැළණි පුර බුදුරැස් විහිදු වන
තිස්ස - කිරිවෙහෙර රුහුණට එළිය දෙන
අම්මේ ඔබේ රුව ඇත මේ සියළු තැන

දළද මහිමි විහිදන බුදුරැස් කිරණයි
සිරිමා බෝ රදුන් බබලන රත් දෙරණයි
තිස් තුන් කෝටියක් දෙවියන් රැක වරණයි
අම්මාවරුණි සම්මා සම් බුදු සරණයි

ඇස්.එච්. කරුණාරත්න
පන්නගමුව

බුදුසරණ 27.09.1994

# යසෝදරා කථා වස්තුව

## අංක : 02

සම්පාදක

පූජ්‍ය අකුරේගොඩ රතනසාර හිමි

# හැඳින්වීම

සිරිමත් ගෞතම සම්බුදු සසුන තුළ ''භද්දකච්චායනා'' මහ රහතන් තෙරණින් වහන්සේ මහත් වූ අභිඥා ප්‍රාප්ත වූ ශ්‍රාවිකා භික්ෂූණීන් අතර අග්‍ර වූහ. එක් බුදු සසුනක මහාභිඥා ප්‍රාප්ත වූ ශ්‍රාවයෝ සිව්දෙනෙක්ම වෙති. සෙස්සෝ මහා අභිඥා ඇත්තාහු නොවෙති. එතුමන් වනාහි කල්ප ලක්ෂයක්ම සිහිකරන්නට සමර්ථ වන්නාහ. මහාභිඥාප්‍රාප්තයෝ වනාහි ඒකසංඛ කල්පලක්ෂයක්ම සිහිකරන්නට සමර්ථ වන්නාහ. අප භාග්‍යවන්ත වූ ගෞතම බුදුරජාණන් වහන්සේගේ සසුනෙහි වනාහි අග්‍ර ශ්‍රාවක දෙනම වහන්සේ සහ බක්කුල තෙරණුවන් වහන්සේ ද භද්‍රා කච්චාන තෙරණියද යන සිව්දෙන ''මහාභිඥා ප්‍රාප්තයෝ'' වූහ.

මෙතුමිය වනාහි පෙර පියුමතුරා (පදුමුත්තර) බුදු සමයෙහි ඉපිද වැඩිවිය පැමිණ වසන්නී දිනක් විහාරයට ගොස් බණ අසමින් සිටියාය. ඒ වේලෙහි සර්වඥයන් වහන්සේ එක් භික්ෂුණියක් මහාභිඥා ප්‍රාප්ත භික්ෂූණීන් අතර අග්‍රස්ථානයෙහි තබා වදාළ සේක. ඒ දුටු මේ උත්තමාව එම තනතුර ගැන අසා බුදුපාමොක් මහ සඟනට දන් දී එම තනතුර පැතුවාය. එතැන් සිට ශක්ති ප්‍රමාණයෙන් කුසල් කොට ඉන් මිය ගොස් ඒ ඒ භවයන් හී දෙව් මිනිසුන් අතර සැරිසරා මෙම බුද්ධෝත්පාදයෙහි සුප්පබුද්ධ ශාක්‍ය රජුගේ අගබිසවුන් කුස පිළිසිඳ නවමස් ඇවෑමෙන් මව්කුසින් බිහිව මහත් වූ රජ සැපතින් වැඩුනාය.

වැඩිවිය පත් ඕ තොමෝ සුද්ධෝදන ශාක්‍ය රජුගේ පුත් සිද්ධාර්ථ කුමරු හා ගෘහ බන්ධනයට ඇතුළත්ව මහත් වූ රජ සැපත් විඳිමින් කල් යවත් හී රහල් කුමරු ප්‍රසූත කළාය. එම දවස්හි සිදුහත් කුමරු ගිහිගෙයින් නික්ම සාවුරුද්දක් දුෂ්කර ක්‍රියාකොට පස්මරුන් දිනා බුදු වූ පසු ඇය මහා ප්‍රජාපති ගෝතමිය වෙත පැවිදි වූවාය. ඕ ප්‍රථමයෙන් යසෝධරා නම් වූ පැවිදි වූ තැන් පටන් භද්ද කච්චානා යැයි ප්‍රසිද්ධ වූවාය.

මෙසේ පැවිදි වූ මේ උත්තමාවිය විදසුන් වඩා රහත්ව අභිඥා වන්හි චීර්ණවශීව විසූවා. එක් පියෙහි සිට ඒකාසංඛ්‍ය කල්ප ලක්ෂයක් සිහි කරන්නට සමත් වූවාය. ඉන් මෑත භාගයෙහි ශාස්තෘන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩසිටි සේක්. ඇය මහාභිඥා ප්‍රාප්ත භික්ෂූණීන් අතර අග්‍රස්ථානයෙහි තබන්නාහු ''ඒත දග්ගං භික්ඛාවෙ මම සාවිකානං භික්ඛුණීනං මහා භඤ්ඤප්පත්තානං යදිදං භද්ද කච්චානා'' යි තනතුරු දෙවා වදළ සේක.

මෙලෙස අප ගෞතම බුදු සසුනහිදි අගතනතුරු ලත් යසෝදරා මහරහත් තෙරණියගේ ආදර්ශවත් චරිතාපදනය පිළිබඳ පූර්ණ විස්තරයක් මෙම දහම් ග්‍රන්ථය තුළින් එළිදක්වේ. යසෝධරා චරිතය හැදෙන වැඩෙන දියණියන්ට, තරුණියන්ට මෙන්ම මුළු මහත් කාන්තා පරපුරටම ගුණකය සරසන මේල පළඳනාවක් වේවා'' යනු අපගේ පැතුමයි. සම්බුදු සසුන තුළ පැවිදිව ශ්‍රද්ධාවෙන් හා වීර්යයෙන් මහණ දම් පුරන මෙම දහම් ග්‍රන්ථය ඉතා ඕනෑකමින් සම්පාදනය කළ ''පූජ්‍ය අකුරේගොඩ රතනසාර'' ආයුෂ්මතුන් වහන්සේට තුණුරුවන් ආශිර්වාද බලයෙන් නිදුක් නිරෝගී සුව දිගාසිරි අත්වේවා ! ඒ අමා නිවන් මග විවර වේවා !

මෙයට මෙත්සිතින්
නාථගණෝ අග්ග වංස භික්ෂු

ශ්‍රී ගුණවර්ධන යෝගාශ්‍රමය
ගල්දූව, කහව
2551 ඇසළ පුර, 18 බුධ දින
2007

# පුණ්‍යානුමෝදනය

බුදුරජාණන් වහන්සේගේ පහළ වීම දෙවියන් සහිත ලෝක සත්ත්වයින්ට මහා සැපතකි. ඥාන සම්පන්න ජනතාව මහා පිංකම් කර ගනිති. බොහෝ දෙනා මාර්ගඵල නිවන් අවබෝධ කොට සසර ගමන කෙළවර කර ගනිති. ඇතැම් අය දෙව්ලොව බඹලොවට යති. නිවන් දකිනතුරු අපා දුකට නොවැටී සුගති ලෝකයන්හි උපත ලබා ගැනීමට සුදුසු පිංකම් කරගත් පිරිසක් ද වෙති. බුද්ධ යන වචනය කල්ප ගණනකින් අසන්නට නොලැබෙන වචනයකි.

මෙම බුදු සසුන පාදක කරගෙන අපගේ ජීවිත සකස් කරගත යුතුය. බුද්ධ, ධර්ම, සංඝ යන තෙරුවන් දිවිහිමියෙන් සරණ යායුතුය. සතුන් මැරීම, සොරකම් කිරීම, කාමයන්හි වරදවා හැසිරීම, බොර කීම, මත්ද්‍රව්‍ය පාවිච්චි කිරීම නොකළ යුතුය. මේ ශික්ෂා පද පස රැක ගැනීම නිසා තමන්ගේ මනස සකස් කර ගත හැකිය. තණ්හාව, තරහව, මෝඩකම, ඊර්ෂ්‍යාව, මානය ආදි කෙලෙස් අඩු කළ හැකිය. එමගින් කායික සුවය, මානසික සුවය සැලසේ. බුදුරජාණන් වහන්සේ පහළ වීම නිසා අනිත්‍ය ලක්ෂණය, දුක්ඛ ලක්ෂණය, අනාත්ම ලක්ෂණය යන ත්‍රිලක්ෂණය පහළවේ. බුදු කෙනෙකුන් ලොව පහළ වන්නේ ත්‍රිලක්ෂණය පහද දීමටය.

ලෝකයේ සියළුම දේ මෙම ලක්ෂණ තුනට අසුවේ. නිර්වාණය, ආකාශය, නාමය යන අසංඛත ධර්මයෙන් ත්‍රිලක්ෂණයට අසු නොවේ වෙනස් වීමක් නැති නිසාය.

දෙමව්පියන්ට සැලකීම, බුදුන් වැඳීම, බණ ඇසීම, භාවනා කිරීම, දානමය පිංකම් කර ගැනීම අප විසින් සිදු කරගත යුතුය. එයින් අපට සැපයක් ලැබේ. පින යනුද සැපයට නමකි. පිං මදි උදවිය දුක් විඳිති. අපාලෝක වලට වැටෙති. එම නිසා අප, දාන, සීල, භාවනා පිංකම් සිදුකර ගැනීමට උත්සාහ වෙමු.

ඒ අනුව කාලීන අවස්ථාවක් ඉටු කිරීමක් වශයෙන් මෙම දහම් පුස්තකය සංස්කරණය කරන ලද්දේ පූජණීය අකුරේගොඩ රතනසාර ස්වාමීන් වහන්සේ විසිනි. උන් වහන්සේට මෙම ධර්මමය කුශල බලයෙන් ධර්ම ඥාන භාවනත් ඥානය වැඩි දියුණු කර ගනිමිනි. සුවසේ පාරමී පුරාගෙන පැතූ උතුම් බෝධියකින් නිවන් සුව ලැබේවා කියා ප්‍රථමයෙන් ප්‍රාර්ථනා කරමු. තවද මෙම ධර්ම පිංකමට උදවු උපකාර කළ සියළු දෙනාටත් අප සැමගේ මවුපිය ඥාති මිත්‍රාදීන්ටත් දෙවියන් සහිත ලෝකයාටත් මේ උතුම් ධර්මය කුසල් බලයෙන් සංසාර දුකින් නිදහස්ව ලබන අජරාමර ශාන්ත ප්‍රණීත අමා මහ නිවන්හි සැනසීමට ලැබේවා කියා එක සිතින් ප්‍රාර්ථනා කරමි.

මෙයට,

කාරුණික,

ගල්දූව කහව
අම්බලන්ගොඩ.

කහගොල්ලේ සෝමවංස ස්ථවිර
ශ්‍රී ගුණවර්ධන යෝගාශ්‍රමය

# පුණ්‍යානුමෝදනය

තිලෝගුරු බුදුරජාණන් වහන්සේ දේශනා කර තිබෙන දුර්ලභ කාරණා අතර අතිශය දුර්ලභ කාරණය වන්නේ බුද්ධ ශාසනයක් තුළ පැවිදි භාවය ලබා ගැනීමයි. ලොව කොතරම් ජනතාව සිටියත් ඒ අවස්ථාව ලැබෙන්නේ ඉතාම ටික දෙනෙකුට පමණයි. එයිනුත් හරි ආකාර පැවිදි ජීවිතයක් ගත කර ගැනීමට ලැබෙන්නේ ඉතාම ටික දෙනෙකුට බව අප දන්නා කාරණයකි. මිහිකත තුළ කොතරම් ගල් කැට තිබුණත් ඒ සියල්ල මැණික් නොවෙති. වනයේ කොතරම් ගස් තිබුණත් ඒ සියල්ල සඳුන් නොවෙති. වනයේ කොතරම් ඇතුන් සිටියත් ඒ සියලු දෙනාගේ ගජමුතු නොමැත. එබැවින් සිවුරු දරූ පමණින් සියල්ලෝම පැවිද්දෝ නොවෙති.

ශාසනික නීතිරීති ගැන බලන විට අප කාටත් එය වැටහෙන කාරණයකි. ශාසනය ඇති කිරීම සහ නැති කිරීම යන කාරණා දෙකම සිදු වන්නේ භික්ෂූන් වහන්සේලා අතිනුයි. එබැවින් ශාසනයක් අතුරුදහන් වීමට ආසන්න වෙද්දී ශ්‍රමණ වේශධාරීන් ඇති වීම ධර්මතාවයක්. ඒ කෙසේ වෙතත් බොරළු අතර මැණික් ඇති බව අමතක නොකළ යුතුයි.

ඒ අනුව මෙම ධර්ම ග්‍රන්ථ සම්පාදනයෙහි යෙදී සිටින පූජ්‍ය අකුරේගොඩ රතනසාර හිමි ධර්ම ධර විනය ධර නිහතමානී කීකරු භික්ෂු නමකි. පියසක් යට දහනට වර්ෂයක් පමණ ශ්‍රමණ ගුණ පුරණ නිසා එය මා ඉතා හොඳින් දන්නා කාරණයකි. එමනිසා අපගේ ආශිර්වාදය වනුවේ මෙම දහම් ග්‍රන්ථය සම්පාදනය කළ පූජ්‍ය අකුරේගොඩ රතනසාර ස්වාමීන් වහන්සේට තව තවත් මෙවන් දහම් ග්‍රන්ථ සම්පාදනය කරමින් මහජනතාව අතට පත් කොට නොමඟ යන ජනතාව සුමගට ගනිමින් නිර්මල පැවිදි දිවිය ආරක්ෂා කරගෙන නිදුක්ව නිරෝගීව පාරමි පුරා

ප්‍රාර්ථනා කරන බෝධියකින් අමා මහා නිවන් ලැබේවා, මව්පිය ගුරු උපාධ්‍යය ආදී නිවන් පිණිස වේවා !

විශේෂයෙන් මම උතුම් ධර්ම දනමය පිංකමට උදව් උපකාර කළ සියළුම දෙනාට උපදින භවයක් පාසා කරදර පීඩාවලින් තොර සැනසිලි ජීවිත පෙළක් ගත කරමින් නිවන් මඟ පාරමී පුරා සංසාර භව කතරින් එතර ලබන අමාමහ නිවන් සැප ලැබේවා කියා ශාසන දයාවෙන් යුතුව ප්‍රාර්ථනා කරමි.

මෙයට - මෙතැති
**ලග්ගල කල්‍යාණ වංස ස්ථවිර**

ශ්‍රී ගුණවර්ධණ යෝගාශ්‍රමය
ගල්දූව - කහව
අම්බලන්ගොඩ.

2551 ඇසල
2009

ශ්‍රී බුධ වර්ෂ 2551 ඇසළ මාසය
23-09-2007

**නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස.../ / /**

**යො කප්ප කොටීහිපි අප්ප මෙය්‍යං කාලං කරොති අති දුක්ඛරාණි**
**ඛෙධංගතො ලොකහිතාය නාතො නමො මහා කාරුනිකස්ස තස්ස**

මහා කල්ප කෝටි ප්‍රකෝටි ගණන් අති දුක් වේදනාවන්ට ගොදුරුවෙමින් පාරමී පුරා සම්මා සම්බුද්ධත්වයට පත් වූ තිලෝගුරු බුදුපියාණන් වහන්සේට නමස්කාර වේවා. අහසේ තරු පරයා යන්න ඇස් දන් දීමෙන් ද, එම තරු පරයා ඉස් දන් දීමෙන්ද, මේ මහ පෘතුවිය ප්‍රමාණය පරයා මස් දන්දී මෙන්ද සතර සාගර ජලය පරයා ලේ දන් දීමෙන් ද ප්‍රමාණ කළ නොහැකි අඹු දරුවන් දන් දීමෙන් ද එකම වෙස්සන්තර ආත්ම භාවයෙහිද පමණක් මහා පෘතුවිය 7 වරක් කම්පා කරවා දුන්නා වූ දනයෙන් දන පාරමිතාව සම්පූර්ණ කළාවූ බුදු රජාණන් වහන්සේට නමස්කාර වේවා !!!

ශ්‍රද්ධාවත් පිංවත්නි

ඉහත සඳහන් ගාථා දේශනාව මාතෘකා කර ලිවීමට යන මෙම කෘතිය එම ගාථා දේශනාවේ නොපෙනෙන එහෙත් සැම පිංවතකුම දන්නා දර්ශන තිරෙනත් පිටු පස සැඟවී තිබුණු මහා බලසම්පන්න බුදුරජාණන් වහන්සේට පමණක් දෙවෙනි වන ගෞතම බුධ ශාසනය තුළ මෙලොව කිසිවෙකුට දෙවෙනි නොවන අති උතුම් නම සිහිකරත් කුසල් පිරෙන කාන්තා රත්නයක් වූ යශෝධරා මහා ස්ථවිරින් නමින් ප්‍රසිද්ධ වූ සියළු සතුන්ගේ මෑණියන් කෙනෙක් වූ රාහුල මාතාවන්ගේ පාරමී බල මහිමය පිළිබඳව විස්තරයකි.

එම යශෝධරා දේවි නම් අප බුදුරජාණන් වහන්සේට සංසාරයෙහිදී සියළුම පාරමිතාවන් සපුරා ගැනීමට මහෝපකාරී වූ සියළුම පාරමිතාවන් සපුරන්නා වූ උතුම් ස්ත්‍රී රත්නයකි. මෙසේ සසර ආත්මයක් ආත්මයක් පාසා බෝසතාණන් වහන්සේ සමඟම අවුත් කෙලවර වෙස්සන්තර ආත්ම භාවයෙහිදී සමතිස් පාරමිතාවන්ගෙන් අඩුව තිබුණා වූ දන පාරමිතාව සම්පූර්ණ කර දෙදෙනාම තුසිත දිව්‍ය ලෝකයෙහි උපත ලබා අපමන දිව්‍ය සම්පත් විඳිමින් අති දීර්ඝ කාලාන්තරයක් එහි සිට බෝසතාණන් වහන්සේ මහාමායා දේවින් කුස පිළිසිඳ ගත් වේලෙහි එම උත්තමාවිය ද තුසී පුරයෙන් අවුත් කෝලිය නුවර මහාමායා දේවියගේ බෑණන් වන සුප්‍රබුද්ධ රජ්ජුරුවන් නිසා සුද්දෝධන රජතුමාගෙ නැගණියන් වන අමිතානම් බිසවුන් කුස තුළ පිළිසිඳ සිද්ධාර්ථ කුමරුන් උපන් වෛශාඛ යොගයෙන්ම එම විගසම තුමුද වජ්‍රකුසින් බිහිව සිද්ධාර්ථ කුමරුසේම ප්‍රසව මඩගල ප්‍රජා ලදහ. සුද්ධෝදන රජතුමා පුතණුවන් බුදුවන බව හෝ සක්විති රජවන බව හෝ අසා අපමන සතුටට පත්වී මා පුතණුවන් බිහිවන වේලේ තවත් එවැනිම බිහිවූ පිංවත් උත්තමයින් සිටිත් දැයි මුළු දඹදිව පිරිස් යවා සෝදිසි කරවිය. බුදු උපතක් සිදුවන වේලෙහි දඹදිව නොව අනන්ත අප්‍රමාණ සක්වල දෙවි, මිනිස්, බඹ ලෝකවල එකම උපතක් හෝ එම වේලාවට නොවන්නේමය. එය ලෝක ධර්මතාවයකි.

මුළු දඹදිව් තලෙයම සෙවීමේදී තම නැගණියන් දියණි කෙනෙකුන් එම විගසම උපනායි අසා ඉතා විස්මයට පත්ව මපුතනුවන් හා එක වේලෙහි උපන් කුමරියක් නම් මපුතනුවන් නිසාම මට යෙහෙළිව උපන්නෙයින්ද මපුතනුවන්ටම භාර්යාව වන සේක්වායි සිතා මපුතනුවන් නිසාම පුතනුවන් සමඟම සසර එන උත්තමාවියක විය යුතුයි සිතා කිරි මවුවරුන්ද සිද්ධාර්ථ කුමරුට සේම සියළුම සැප සම්පත් දී රැක ගත්තේය.

මෙසේ වැඩෙන එම පිංවත් කුමරියගේ රූප ශෝභාව නිසාම බිම්බාදේවී නම් ලදහ. දඹදිවටම ඒ හා සමාන රූප ශ්‍රී ඇති ස්ත්‍රී රත්නයක් නැත. දෙදෙනාගේම වයස අවුරුදු 16 වන විට රජතුමා මගේ පුතාට බුදුවීමට වන ගත වුවහොත් බොහෝ සේ දුක් ගන්නා නිසා ඔහුට චක්‍රවර්ති රජකම ලබාදීම සඳහා කාම බන්ධනයෙන් තබා ගැනීමට බිම්බා දේවීන් සරණ පාවාදී ඔටුනු පැළැන්ද වූහ. දෙදෙනාටම වයස 29 වන විට මහා පිරිවර සම්පත් තිබූ නිසා යශෝධරා දේවියයි දෙවන නමක් විය. රාහුල පුතු බිහිකල දින තපසට ගිය නියාස දූන යශෝධරා දේවියද යාමට උත්සාහ කිරීමේදී රජතුමා බොහෝ සේ ඇවිටිලි කර රඳවා තබා විශාල මුරකාවල් ද යෙදවීය. සිද්ධාර්ථ කුමාරයා තපසට ගිය නියාව දූන ඒසා රූප ශ්‍රීයෙන් බබලන ස්ත්‍රී රත්නයක් දඹදිවම නැති නිසා වෙන රජවරුන්ගෙන් ආරක්ෂා කිරීමටත්ය.

ඉන්පසු එතුමිය ද රජ මාලිගාවේ සිද්ධාර්ථ කුමාරයා කරන දුෂ්කර ක්‍රියා සොයා බලා ඒ අනුවම හැසුරුණේය. මෙසේ සත් අවුරුද්ද මුළුල්ලෙහිම අපමන රජ සැප තිබෙන මාලිගාවේ එක් වේලක් ආහාර අනුභවයෙන් ද දුෂ්කර තපස් ජීවිතයක්ම ගෙවා බුදු වී වැඩී වේලේ සුද්ධෝදන රජතුමා බුදුරජාණන් වහන්සේට දන්වා සිටි අවස්ථාවේ පිය රජතුමා සමගින් යශෝධරා මෙහෙණින් වහන්සේ සිටි මාලිගාවට යන අතර පිය රජතුමාට දන්වා සිටියේ ඇයට රිසිසේ මා වන්දනා කිරීමට ඉඩ සලසා දෙන ලෙස එයට එකඟව තම ලේලියට බුදුරජාණන් වහන්සේ වැඩි බව දන්වා සිටි අවස්ථාවේ සසර අති දීර්ඝ කාලාන්තරයක් එකටම පතාගෙන සෙවනැල්ලසේ ආපුරුද්දට බුදුරජාණන් වහන්සේගේ දෙපා දූඩීව අල්වා ගෙන හැඬුවේය. පසුව පියවි සිහි උපදවා පසෙකට වී වන්දනාමාන කරේය.

පසුව බුදුරජාණන් වහන්සේ පිය මහ රජතුමාටත් යශෝධරා දේවියගේ තිබූ ස්වාමි භක්තිය සමතිස් පාරමී සපුරා දීමට කළ මෙහෙය සහ එතුමියගේ ගුණ වර්ණනාව බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී මුඛයෙන් දේශනා කරන විට ඇති වූ සතුටට එම අවස්ථාවේම පැවදි වීමට තීරණය කළත් රජතුමා සහ ප්‍රජාපති ගෝතමීන් වහන්සේගේ ඉල්ලීමත් උඩ නිසොල්මන් විය. පසුව රහල් කුමරුන් පැවිදි වූ පසු පිය, පුතු දෙදෙනාම පැවදි වූ පසු මට මෙම රාජ සම්පත්තියෙන් කුමනකාරියක් ද කියා මුරන්ඩු සිත් ඇතිව තම යෙහෙළි පිරිස ද සමග සැවැත් නුවරට වැඩම කර බුදුන් වැඳ ආකාරිය පැවසූ විට බුදුරජාණන් වහන්සේ එවිට මුව නොසෑහෙන පරිදි යශෝධරා තෙරින්ගේ ගුණ වර්ණනා කර උභතො සංඝයා කෙරෙහි උපසම්පද කරවා සුදුසු කර්මස්ථාන උගන්වා.

''**රාහුල මාතාවෙනි, බුද්ධොත් පාද දුර්ලභය, ක්ෂණ සම්පත්ති දුර්ලභය, බුද්ධ දර්ශන දුර්ලභය, මනුෂ්‍යත්ව දුර්ලභය, පැවිද්ද දුර්ලභය අප්‍රමාදව ත්‍රිවිධ වූ ශික්ෂාවන් සම්පාදනය කරව**''යි අවවාද දී සිටියේය. දැඩි වීර්යය උපදවා දෙපොයක් ඇතුළත රහත්භාවයට පැමිණියේය. මහා සාගරයට ගඟක් ගලා බස්නා සේ යශෝධරා තෙරණින් වහන්සේ බැලීමට රජ බමුණු ආදි නොයෙක් මනුෂ්‍යයන්ගේ සිව් පස පූජාවන්ගෙන් ආවාසය අතුරු සිදුරු නොමැතිව පිරෙන විට නැවත බුදුරජාණන් වහන්සේගෙන් අවසර ගෙන මහා ප්‍රජාපතී ගෝතමී වහන්සේ වැඩ සිටින විශාලා මහනුවරටම පිරිවර සමඟ වැඩම කර එහි අරනක වැඩ වාසය කරමින් සිටිනාතර පෙරටත් වඩා සිව් පස ලැබීමට හේතුව බෝසතාණන් වහන්සේ දන පාරමිතාවන් පුරන සමයෙහි කිසිම ලෝභ සිතක් නොඋපදවා සිත් සතුටින් දන් දීමේ විපාකයි. බුදුරජාණන් වහන්සේ ගම් දනව් සැරිසරමින් ලො සතුන්ට නිවනට මග සාදමින් රජගහනුවර ගිජ්ජකූට පර්වත

ප්‍රාන්තයෙහි එක්තරා සිත්කළු ස්ථානයක වැඩ සිටි යශෝධරා ස්ථවිරින් වහන්සේ ද දහස් ගණන් භික්ෂුණීන් සමඟ ගොස් බුදු රජාණන් වහන්සේ වැඳ එකත් පස්ව හිඳ ධර්ම ශ්‍රවනය කරති.

එක් දිනක් යශෝධරා ස්ථවිරින් වහන්සේ තම අසපුවේ භාවනානුයෝගීව වැඩ හිඳ මෙසේ සිතන සේක. නන්ද රාහුල දෙදෙනා ද අගසව් දෙදෙනා ද, අග්‍ර ශ්‍රාවිකාව අග්‍ර ශ්‍රාවක අනේපිඬු සිටුතුමා ද, ශුද්ධෝදන - මහරජ ප්‍රජාපති දෙදෙනා අඤ්ඤා කොණ්ඩඤ්ඤා ස්ථවිරයෝ ද දැනට පිරිණිවන් පා නිවනට පත් වූයේය. මමද බුදුන් හා එකටම උපන්න එක හා සමාන වයස් විමි. සමවු මහන දම් පුරා නිවන අවබෝධ ලදිමි.

එසේ හෙයින් දෙදෙනාගේ පරිනිර්වාණය ද එකම දින සිදුවන්නේය. එවිට ලෝක සත්ත්වයාට දරා ගත නොහැකි දුකක්ම වන්නේය. එම නිසා මෙම පරිනිර්වාණ දෙකෙහි වෙනසක් උවමනාය. බුදුරජාණන් වහන්සේගේ පරිනිර්වාණය දැකීම මාහට සුදුසු නැත. මාගේ පරිනිර්වානය බුදුන්ට පළමු විය යුතුය. පූර්ව කාලයෙහිත් අනන්ත බුදුරජාණන් වහන්සේලාගේ පතිවෘත්තාවන් ද බුදුන්ට පෙරාතුවම පිරිනිවන් පා වදළ සේක. මේ වන විට බුදුන්ට ද මටද සම වයස් වූ 78 සම්පූර්ණ කර තිබේ. මෙයින් දැවුරුද්දක් ගිය කල බුදුන්ගෙ පරිනිර්වාණය ද වන්නේය. එනිසා දැන්මම බුදුරජාණන් වහන්සේගෙන් අවසර ගෙන අද රෑ මම නිවන් පුරට නික්මෙමියි කියා සිතූ සැනින් මිහිකත ගුගුරා ගියේය. ආකාශය මේඝ නාදයෙන් කම්පා විය. එම කම්පාවත් සමඟ යශෝධරා ස්ථවිරියන්ගේ පිරිවර ස්ථවිරියො 1000 ක් පමණ වටකර ගෙන මේ කුමන දෙයක් දැයි ප්‍රශ්න කළේය. නැගනිවරුනි මෙය මා සිතූ සිතිවිල්ලයි. ඒ නිසා සැවොම මා සමඟ බුදුරජාණන් වහන්සේගෙන් අවසර ගැනීමට යාමට සූදනම් වන්නැයි දැන්වූයේය. සියළුම මෙහෙණීන් වහන්සේලා පා සිවුරු දරාගෙන වැඩ සිටි අරමට අධි ගෘහිත දෙවියන්ට පිං පමුණුවා මහ

පෙරහරින් මගට බැස ගමන් කරන අතර දෙපස රැස්වූ සෙනගට තම ආදරණීය මෑණි කෙනෙකුන් අවවාද කරන ආකාරයට අප්‍රමාදව කුසල් රැස් කර ගැනීමට අවවාද දෙමින් ගංගාවක් සාගරයට ගලා බස්නා ආකාරයට බුදුරජාණන් වහන්සේ වෙතට පැමිණ තුන්යලක් පැදකුනු කොට බුදුන් පසග පිහිටුවා වැඳගෙනම එකත්පස්ව හිඳ මෙසේ දන්වන සේක.

ස්වාමීනි, සත් දවසකින් ලැබෙන සත්විති රාජ්‍යයක් හා සතර මහා නිධානයක් ද, කිඹුල්වත් නුවර වැනි දිව්‍ය සමාන පුරයක්, සුද්ධෝදන රජුවන් දයාබර පියෙකු, අසීමිත ස්ත්‍රී රත්නයක් හා සයානු ලක්ෂයක් ක්ෂත්‍රිය කන්‍යාවන්ට අධිපති වූ මා වැනි ස්ත්‍රියක්, රහල් පුතනුවන් පිංබර පුතකුද හැරදමා වනයට ගොස් සය අවුරුද්දක් දුෂ්කර ක්‍රියා කරමින් ද, මාර පරාජය කරමින්ද, මහත්වූ වික්‍රමයෙන් සම්මා සම්බුද්ධ රාජ්‍යයට පැමිණ මා ඇතුළු සියලුම සත්වයින්ට ආදරබර පියෙකු වූ නිවන් හිමියාණෙනි, මා විසින් දන්වන තෙපුලක් අසා වදළ මැනවි. දැන් මට අට සැත්තෑවක් වයස් ගොස්ය. එසේ හෙයින් පබ්භාර දසකට (කුදු ගැසෙන තත්ත්වයට) පැමිණියෙමි. ස්වාමි දරුවන්ට පළමු කොට ජරා විලිපිලි නොදක නිවන්පුර යනු කැමැත්තෙමි. අද රෑම නිවන් පුරයට යාමට කැමැත්තෙමි. ස්වාමි දරුවන් විසින් මට කලමනා වූ සංසාර රක්ෂාව කොට වදරන ලද මා විසින් දූ පිළිගන්නා ලද එසේ හෙයින් මම ද සංසාර සාගරයෙන් ගොඩ නැගී නිවන් පුරය පැමිණියෙමි. පූර්ව කාලයෙහිත් අනන්ත බුදු රජාණන් වහන්සේලාගෙත් පතිව්‍රත්තාවුන්ද පරිනිර්වාණ දිනයෙහි අවුත් බුදු අතින් සමුගැන්ම ද, බුදුන් ක්ෂමා කරවීමද, සාධාරණ ධර්මතාවයක් වන බැවින් මමද ස්වාමි දරුවන් ක්ෂමා කරවාගෙන අවසර ලබනු කැමැත්තෙමි. සසර බොහෝ කාලයක් ස්වාමි දුරුවන්ට සෙවනැල්ලක් සේ සහවාසව ආයෙමි. එසේ වුවත් ස්වාමි දරුවන්ගේ පාරමිතාවටම එය ද අනුබලයක් විය. මා කල දැඩිකමත් පාරමිතාවලට අනුබලයක්ම විය. ස්වාමීනි, එකම කුස ජාතකයෙහි දී මා වෙනුවෙන්ම ඔබ වහන්සේ හත් අවුරුද්දක් අරක්කැමි

කම් කළෙත් දිවා රෑ රජවාසලේ දසයෙකු බවට පත්වූයේත් විරූපී මුහුණක් (කැවුම්) ලැබුවේත් මා නිසා නොව ඔබ වහන්සේගේ පෙර කර්ම අකුසල විපාකයක් නිසා විය. මාගේ වරදක් නොවෙයි. එම ආත්මභාවයේ සත් දිනක් නිරොධ සමාපත්තියෙන් වැඩ සිටි පසේ බුදුන් වහන්සේ පිඩු සිඟා වඩින අතර ඔබතුමාට තියපු කැවුම් එම පසේ බුදුන්ට මා විසින් පූජාකර බව දන්වා සිටි විට පාත්‍රයට අතදමා ගත් පාපයෙන් එවැනි විරූපී මුහුණක් ලැබුණත් පසුව ඔබ වහන්සේට නින්ද කර ශ්‍රද්ධාවෙන් නැවත පූජා කරවපු බලයෙන් අපාගත වීමෙන් ද විරූපී මුහුණ නැතිවීම ද මා නිසාම විය. තවද එම ආත්ම භාවයෙහිදීම මා නිසා ඔබ වහන්සේ පාරමිතාවන් 10 ක්ම කර ගත්තේය. එපමණක් ද ශක්‍රදේවේන්ද්‍රයාගෙන් අශ්ඨවංක වෛරොචන මානිකාය රත්නයද පළඳවා ගන්නා ලදී.

ඔබ වහන්සේ මා නිසා සය අවුරුද්දක් සියලුම රජ සැප හැරදමා (කුස) රජවාසලෙ අරක්කැමි වැඩ කරපු වෙලේ ඔබ වහන්සේ අතින් පිසින එකම බත් පිඩක් හෝ අනුභව නොකොට යවහාල් බත්ද කිසිම රජ සැපත් ද නොගත්තේ මෙම ආත්මභාවයෙ සය අවුරුදු දුෂ්කර ක්‍රියා කළ කාලයේ හැසිරුණු ආකාරයටමය. එයත් මගේ වරදක් නොව ඔබ වහන්සේගේම පෙර අකුසල් නිසා වූ දෙයකි. තවද එක් ආත්මභාවයකදී අප දෙදෙනා නිවැරදි කුඹල් කර්මාන්තයෙන් ජීවත්වෙත්දි එක් පසේ බුදුන් වහන්සේ නමක් දැක පැහැදී දන්දී අප දෙදෙනාම දෙදෙනා පළමුව මහනවෙමියි සිතා කළ ප්‍රාර්ථනාව අනුව මෙම ආත්මභාවයේදී රාහුලව ඉපදුනු පුතුට මාස 5 වන අවස්ථාවේදී මට පළමුව තපසට යාමට සූදනම් වූ අවස්ථාවේදී වතුර කලයක් ගෙනෙන තුරු නවතින්න කියා දරුවා ඔබ අතට දී ස්ත්‍රී මායවක්කර මම තපසට පළමුහියෙමි එසේ මායමින් සොරා ගියෙත් සසර දුකෙන් මිදීම නිවන් ලැබීම සෑම සත්වයාටම ප්‍රියමනාප නිසාමය එවිට ඔබ වහන්සේ මවු තනතුරේ සිට දවසෙන් අඩක් කුඹල් වැඩකර උපයන මුදලෙන් දරුවා පෝෂණය කර අවුරුදු 5 ක් යනතුරු දරු සෙනෙහසින්

ඇති දැඩි කළ විට දරුවා වෙසතුරු ආත්ම භාවයේදී ජූතක බමුණාට බියෙන් පොකුණේ නෙළුම් කොළ අතර සැඟවී සිටියදී ජාලිය ජාලිය කියා අමතද්දී ජීවිතයට බියේ සැඟවී සිටීම මවුපියාණන්ට කරන අකීකරුකමක් ලෙස සිතා වහා අවුත් මාපියාණන් මා මෙතන සිටියෙමි. කැමැත්තක් හා මා දන්දුන මැනැවියි කියා දැත් දිගුකර කෙළෙහිගුණ සැළකුවේය. ඔබ මවු තනතුරේ සිට කළ දරු සෙනෙහයට දුන් පාරමිතාවක් විය. තවත් එක් ආත්ම භාවයකදී ඔබ වහන්සේ රජව මම අගබිසව සිටියදී මාගේ වැඩි වයසත් ඔබගේ අඩු වයසත් නිසා මායමින් මගේ සුදු කෙස්ගසක් ඔබ වහන්සේගේ අතටදී මෙය ඔබ වහන්සේගේ නරකෙසක්ය සෙනේහයෙන් එක් මායමක් රැවටීමක්කර එම මොහොතේම සියළුම රාජ සම්පත් අමාත්‍යන්ට පවරා මාහට රාජ්‍ය උරුමකර දී ජීවිතාන්තය දක්වා තපස් රැක නෛෂක්‍රමය පාරමිතාව සහ ශීල පාරමිතාව යන පාරමිතාව දෙකක් සාද දුනිමි. තවද කුරු ධර්ම ජාතකයෙහිදී ඔබ වහන්සේ රජව මා අගබිසව සිටියදී මා එක් දිනක් යුවරජ කෙනෙකුගේ මුහුණ රාගයෙන් බලාපු වරදක් සිහියට නැගී මාහට ශීල අන්තරායක් වූවා යැයි බියෙන් එය නොසඟවා ඔබ වහන්සේට දන්වූයෙන් මා එම වරදෙන් මිදුනෙමි. සංසාරය නම් අගක් මුලක් නොපෙනෙන හෙයින් අභ්‍යන්තර ජාතික - සුසීම ජාතකාදියෙහි වෙනත් රජවරුන්ට මම අගමෙහෙසිය වූයෙන් එහි වරදක් නැත. ඒ කෙසේ වෙතත් මා අතින් දැන නොදැන යම් වරදක් වූවා නම් මේ අන්තිම වූ ක්ෂමාවය, අන්තිම වූ දර්ශනය, අන්තිම වූ ජාතියය මට විශේෂයෙන්ම ක්ෂමා කොට වදරා ශාන්ති පුරයට අවසර දුන මැනවයි දන්වූයේය.

මෙසේ ඒ යශෝධරා ස්ථවිරින් වහන්සේ අනේකප්‍රකාර වූ කථාවෙන් සසර තමන් වහන්සේගේ පූර්ව විශ්වාසය හඟවා බුදුරජාණන් වහන්සේ අතින් අවසර ඉල්ලූ අවස්ථාවේ තමන් වහන්සේට සසර කළා වූ බොහෝ උපකාර හා අපරිමිත ගුණ දැක්වේ. යශෝධරාව වැනි ස්ත්‍රියක් මාගේ බුද්ධෝත්පාදයෙහි නැත දන් මෝ තොමෝ අසංඛ්‍ය ගණන්

කල්පවල ජාති දක්නා නුවණ ඇත්තිය අසාධාරණ වූ දවැස් ඇත්තිය නසන ලද අශ්‍රවයං ඇත්තිය ත්‍රිවිද්‍යාවෙහි මුදුන් පැමිණියාය. බුදුරජාණන් වහන්සේ කෙනෙකුට සමාන සෘධි ප්‍රාතිහාරය ඇත්තිය අසාධාරණ වූ දිවැස් ඇත්තිය නසන ලද අශ්‍රවයං ඇත්තිය ත්‍රිවිද්‍යාවෙහි මුදුන් පැමිණියාය. බුදුරජාණන් වහන්සේ කෙනෙකුට සමාන සෘධි ප්‍රාතිහාරය ඇත්තිය තමා රහත් වූද පටන් බුදුන් කෙරෙහි කළ මහත් වූ ආදර හා බහුමානයෙන් පෘතග්ජන මෙහෙණි කෙනෙක්ගේ නිහතමාන ගුණයෙන් තමාගේ කිසිම හැකියාවක් නොපෙන්වා සිටියේය. මැයගේ සෘධිබල දුටුවෙක් කිසිවෙක් නැති නිසා මතු ලෝක සත්ත්වයෝ රාහුලමාතා කෙසේ කෙනෙක් ද රහත් භාවයටවත් පැමිණියාද කියා කුකුසක් ඇති කර ගනිති. මතු උපදින සත්වයින්ට මැයගේ සෘධිබල වික්‍රම හා පූර්ව චරිතය මැය ලවාම දක්වා මැයගෙ ගුණ මතු මාගෙ ශාසනයෙහි ප්‍රසිද්ධියක් වේවයි සිතා යශෝධරා ස්ථවිරිනි තොප වැනි අති උතුම් අති ශ්‍රේෂ්ඨ පිංවතියක් ලෝක වාසීන්ට ආනුභාවයක් නොදක්වා අප්‍රසිද්ධව නිවන් පුරයෙහි සැඟවීම නොසෑහේ. දැන් තොපගෙන් .......... පෙළහරක් මා ඉදිරියේදී දක්වායි වදාළ සේක. එවෙලෙහි යශෝධරා ස්ථවිරයන් වහන්සේ අද මාගේ පිරිනිවීම සඳහා අවසර ගැනීමට පැමිණීම ඉතා සුළු කාලයක් තුළ මුළු දඹදිව පුරා පැතිරී ගොස් කෝටිගණන් පිරිස මා දකීම සඳහා බුදුරජාණන් වහන්සේ වැඩවසන වෙහෙරට ගංගාවක් ගලා බසින ආකාරයට එන්නේය. පෘතග්ජන භික්ෂූන් වහන්සේලා කුඩා ළමයින් සේ අඬන්නේය. අවට වැඩ සිටි භික්ෂූන් වහන්සේ ද රාහුල මාතාවන් දකගනිමියි සිතා කිය පැමිණෙන්නේය. එකල යශෝධරා මහා ස්ථවිරින් වහන්සේ අද බුදුරජාණන් වහන්සේ මහා පෙළහර කරවා මා හා සිංහනාද කරවන කැමතිසේක් වන පෙර අනන්ත ආත්ම භවයන්හි ස්වාමීන්ට කීකරුවම ඇවුත් අවසාන ආත්මභවයේදී වදළක් කළ මැනව සිතා බුදුන් අදහස් වූ පරිද්දෙන්ම මගේ සෘධිබල දක්වා පෙළහරක් කරමියි සිතා මෙපෂිදයෙහි සරාගී සත්ත්වයෝ බොහෝය. ඔවුන් ස්ත්‍රී භවයෙහි මා දක්වන්නා වූ

පෙළහර බලා මා වූ පවත් නොදන මා කෙරෙහි රාග සිත් ඉපදවූයේ නම් එම පව්න් අපාගතවන නිසා රැස්ව සිටි කෝටි ගණන් සත්ත්වයින්ට රාහුලමාතා නොහොත් යශෝධරා මහා ස්ථවිරින් වහන්සේ බව අඟවා පෙළහරක් දක්වමියි සිතා බුදුරජාණන් වහන්සේ වැඩ සිටි දිසාවට වැඳ සිට සෙසු බෝසත්වරුන් අටාසංඛ්‍යය කල්ප ලක්ෂයකින් සොළසා කල්ප ලක්ෂයකින් කරන්නා වීර්ය සාරාසංඛ්‍යය කල්ප ලක්ෂයක් ඇතුළත සාක්ෂාත් කොට මා වැනි ස්ත්‍රියකගේ අනුබලයෙන් පුරනිමාවගත් අධිතවූ වීර්ය ඇති බුදුරජාණන් වහන්සේ ඔබ වැනි බුදු කෙනෙකුන් ඉදිරියෙහි පෙළහරක්පානාවූ මම දෙවි - බඹ කෙනෙකුගෙන් උපදෙස් ලත් වෙනත් සෘධිවන්ත කෙනෙකු නොවෙමි. නුඹ වහන්සේ පෙර සිද්ධාර්ථකුමරයෝ යැයි දඹදිව ප්‍රසිද්ධව ශක්‍ර දේවේන්ද්‍ර ලීලාවෙන් රාජ්‍ය කරන කළ සයානූ ලක්ෂයක් පුරස්ත්‍රීන්ට නායකව අග්‍ර මහේෂිකාව වූ යශෝධරා දේවින්නම් මමය. එකල රූපයෙන් යෞවනයෙන් - කුලයෙන් - යශසින් - ආචාරයෙන් අග්‍රවූත් ස්ත්‍රී සමූහයා දිව්‍ය අන්ගනාවක දුටුවා සේ මටද වඳිති පුදති සත්කාර කරති. එහෙත් එම සියළුම සැප සම්පත් මම ස්වාමි දරුවන් සමීපයෙහි මහනව උපදෙස් පරිද්දෙන් විදර්ශනා වඩා අමා මහ නිවන් දුටිමි. සියළුම කෙළෙසුන් නසා උතුම් වූ රහත් භාවයට පැමිණියෙමි. නැවත මාගේ උපතක් නැත. මෙසේ වදළ සත් වරක් අහසට නැග සත් වරක් බිමට බැස රන්හංස දේනුවක සේ බුදුරජාණන් වහන්සේ ගේ ශ්‍රීපාද වන්දනා කරමින්

යශොධරා අගංවීර - අගාරෙඨෙ පජාපති

සාකියමුනි කුලෙජාතා - ඉත්ථියගෙ පතිට්ඨිනා යි - යන මේ ගාථාවෙන් සත්වරක් සිංහනාද කොට නැවත සියදහස්වර අහසට නැග බිමට බැස බුදුරජාණන් වහන්සේගේ ශ්‍රීපාද වන්දනා කරකර අහසේ පැයූ පූර්ණචන්ද්‍රයා සේ සියළු සත්වයින්ට මා පෙනේවායි අධිෂ්ඨානකොට දෙව්යෙනි බ්‍රහ්මයෙණි යශෝධරා ස්ථවිරීනම් මමය. අද බුදුන්ට මා විසින්

කරන ප්‍රාතිහාර්ය ප්‍රජාදක්නට එක්වයි දසදහසක් සක්වලට ඇසෙන සේ හඬ නැගීය. එම ශබ්දය දසදහසක් සක්වල මුළුල්ලෙහි සැටදහසක් කාමාවචර දිව්‍යලෝකවල දෙවියන්ටද එක් ලක්ෂ පනස්දහසක් බ්‍රහ්මලෝකවලට ද ඇසී ගියේය. එක් ඇසිල්ලකින් අහස පුරා දිව්‍ය බ්‍රහ්ම ආදී දෙවියන්ගෙන් අතුරු සිදුරු නැතිව පිරී ඉතිරී ගියහ. එම මධුර ස්වරය ඇසුණු මුළු දඹදිව සියළු වැසියෝ පූර්ණ චන්ද්‍රයාසේ වැඩ සිටි උන්වහන්සේට දෙහොත් මුදුනින් වැඳ සිටියාය.

සියළුම ගම් දනව්වල සියළුම සත්වයෝ තමතමන්ගේ ගෙදර දෙර සිටම සාදුකාරදිදී වැඳ හුන්නේය. එවෙලේ උන්වහන්සේ තෙජොකසින සමාපත්තියට සමවැද සියලගින් ගිනිකඳු හැර මුළු ලොවම ගිනි ජාලාවෙන් පුරා මම බුදුන් ගිනිගෙයි වසන කල රහල් තෙරුණ්ගේ මව වූ යශෝධරා නම් ස්ථවිරිමියි හඬගා කියා මුළුලෝ සාදු නාදයෙන් පුරා මදක් පෙනිමින් සිටිමින් වරක් නොපෙනී අන්තර්ධාන වන්නේය. නැවත යශෝධරාව මෙහෙණි රූප දහස් ගණනක් මවා සැමටම පෙනෙන සේ සලස්වා මමය බුදුන්ට පාරමිතා සාධා දුන් යශෝධරා ස්ථවිරිනිය කියා තුන් ලොවම සාදුකාර දුන්හ. නැවත මාගේ බුදුන්ට ගරුඬ විතානයෙකින් පූජාවක් කරමියි සිතා මුළු සක්වලම වැසී යන ගරුඨ රාජ වෙසක් ගෙන නාද දක්වමින් සීයක් යොදුන් මහ දඹ ගස මුලිනුපුරා බුදුරජාණන් වහන්සේට පවන් සැලූ සේක. සත්වයෙහි දිව්‍ය නාගරාජයෙහි බිය නොව මම යශෝධරා ස්ථවිරිමියි පවසනවාත් සමඟම සැවොම සාදුකාර දුන්නේය. නැවත අහස් කුස වසා සිටින සේ දිව්‍ය හස්ති රූපයක් මවා මුළු ලොවට පෙනී පෙනී ශක්‍රපුරයට අත දිගු කර පරසතුමධාරා ගසගෙන බුදුන් සිරසට මල් සේසතක් මොහොතක් සිට මල් සුවඳින් බුදුන් පුද මම තමයි යශෝධරා ස්ථවිරීන් කීවාය. මුළු ලොවම එකම සාදුකාරයෙන් ගිගුම් දුන්නේය. එම ආකාරයටම අශ්වරූපයක් මවා පෙළහර කළහ. සියළුම සත්වයන් ලවා සාදුකාර දෙවූය.

එයින් පසු මෙහෙණින් වෙසින් පෙනී සිටිමින් සත්වයෙහි කල්පාන්ත වාතයෙහි මහා පර්වත රාජයන් ආකාශයට නැගෙන ලෙස ඒ ගැසී සුණු විසුණු වන ලෙස පුළුන් පොදක් සේ බඹන ලෙස මාගේ බුදුන් සද්ධර්මයෙන් තොපට දක්වා වදාළ සේක. මම ඍධි බලයෙන් දැන් ඒ ගෙනහැර පාමි අහස්කුස කල්පාන්තය සේ මහාවාත මණ්ඩලයක් වඩා මහා පර්වතරාජයන් පොළොවින් නැගී දරුණු කුණාටුවක් සේ සෑම අතටම කරකවා සියළුම සත්වයින් මවිත කරමින් බුදුරජාණන් වහන්සේට පූජාවක් කෙරෙහිය. සියළුම සත්වයෝ සාදුකාර දුන්නේය. නැවත එය අන්තර්ධානය කර අහස මහා සමුද්‍රයක් බවට පත්කර දහස් ගණන් යොදුන් දිග දිව්‍ය මත්ස්‍ය රූපයක් මවා වරපත් ලෙළවමින් පිහිනනවා සේ පෙන්වා ජල රාජ නම් ඍධිපූජාවක් කළ සේක. එයද අන්තර්ධාන කර සත්වයිනි දහවල් තාරුකා පිරි සඳක් දුටුදැයි විමසා තිබෙන සඳ මඬල පනස් යොදුන් විශාල තරු තාරකා නක්ෂත්‍රතාරකා 27 රාශි 12 රාශි ග්‍රහයින් දෙළොස් දෙනා දහස් ගණන් තාරුකාවන් සත්වයින්ට පෙනෙන්නට සලස්වා එයින්ද බුදුන් පුද සිංහනාද කරන කේෂරසිංහරාජයකු විලසට සත්වයිනි මම සඳ දෙවියෙක් නොවෙයි ගෞතම නම් බුදුරජාණන් වහන්සේගේ පාරමිතා සම්පූර්ණ කර දුන්නා වූ යසෝදරා ස්ථවිරීන් වහන්සේමයි කියා සිංහනාද කළ විට සියළුම සත්ත්වයෝ එක හඬින් සාදුකාර දුන්හ.

එවිට මෙම ඍධිපෙළහර දුටු එකද කාන්තාවන් වත් නැර සෑම කාන්තාවක්ම මමද මතු බුදුබව පතන උත්තමයින්ට පාදපරිචාරිකාවක් වේවායි ප්‍රාර්ථනා කළහ. එසේම හිරුමඬල ද මවා පෙළහරකර සූර්‍ය විමාන පෙළහරක් කර බුදුන් පිදීය. නැවත සත්වයින් මාගේ බුදුරජාණන් වහන්සේ සක්‍රයාගේ සම්පත් තොටප සද්ධර්මයෙන් පෙන්වූයේය. දැන් මම තොපට එය ඍධිබලයෙන් පෙන්වමියි කියා මුළු ශක්‍ර සම්පත්තියම දසදහසක් සක්වල සත්වයින්ට පෙනෙන්නට සැලැස්වීය. එවිට දසදහසක් සක්වල සක්‍ර දේවේන්ද්‍රයො මෙය කිනම් සක්‍ර දෙවියෙක් දැයි විමතියට පත්වූ

අවස්ථාවෙ මම සක්‍රයෙක් නොවෙමි. තමන් මව් කුසින් උපන් වෙලෙහි පවා දසදහසක් දෙවියන්ගෙන් වැඳුම් පිදුම් ගන්නාවූ බුදුරජාණන් ගිහිකළ එතුමාගේ අග බිසව වූ යශෝධරා දේවීයි හඬගා කී සේක. එවිට සෑම සත්වයෙක්ම එකහින් සාදුකාර දී මම බුදුවෙමියි ප්‍රාර්ථනා නොකළ එකද පුරුෂයකුද නොවීය. සැවොම බුදුබව පැතීය. මෙසේ නොයෙක් නොයෙක් පෙළහර පාමින් සියළු සක්වල සත්වයින් මවිත කර දූන් මෙම සත්වයින්ට දේශනාවක්මැයි සිතා දෙළොස් යොදුන් මහා බ්‍රහ්ම රූපයකින් පෙනී සිටිමින් මාගේ බුදුන් නාරද නම් බ්‍රහ්මරාජයාව සිටියදී නොදුටු කෙනෙක් මා දකිත්වායි සිතා ආකාශයේ පලක් බැඳ වැඩසිට එකෙනෙහි එක්ලක්ෂ පනස්දහක් බ්‍රහ්මරාජයන් ආදී සියළුම දිව්‍ය සේනාව කෝටි ගණන් මනුෂ්‍යයින් එක නාදයෙන් සාදුකාර දී වඳිමින් ඔබ වහන්සේ කිනම් බ්‍රහ්මලෝකයක බ්‍රහ්මරාජයෙක් දැයි විමසූ විට සත්වයිනි මම දෙවියෙක් බඹෙක් නොවෙමි.

ගෞතම නම් බුදුරජාණන් වහන්සේට සංසාරයෙහි පක්ෂපාතීව ආ එක් කුල දුවෙකි. එකම ආත්ම භාවයක ස්වාමි දරුවානන් මහා සුදර්ශන නම් චක්‍රවර්ති රජව දෙළොස් යොදුන් සකරුවන්මය නුවර අසංඛ්‍යයක් අවුරුදු රාජ්‍ය ශ්‍රී සමයෙහි සුවාසූ දහසක් බිසවුන්ට අගමෙහෙසිය වූ සුභද්‍ර නම් අගමෙහෙසිය මෙසේ නොයෙක් ආත්ම භාවයන් දක්වා සිටියේය. තවත් විස්තර පන්සිය පනස් ජාතක පොත්වලින් දැකගත හැක. සසර ඒසා අතිදීර්ඝකාලයක් ඔබ වහන්සේට පක්ෂපාතීව සියළුම පාරමිතාවන්ට උපකාරී වූ ද ඔබ වහන්සේත් එසේම මටද පුරුෂයන් විසින් ස්ත්‍රීන්ට කළමනා වූ ආදර සහිත තෙපුල් කීමද අනාදර මිශ්‍ර තෙපුල් නොකීමද කලින් කලට වස්ත්‍රාභරණ සපයා දීමද ගෘහ කටයුතු මටම භාරදීමද මෙකී නොකී සියළුම තම භාර්යාවන්ට කළමනා කටයුතු ඉටු කළේය. එසේම මමද නියම ස්වාමි භක්තියෙන් ගෞරවයෙන් පර පුරුෂයන් ගැන නොසිතීම රැස්කල ධනය ප්‍රවේශමෙන් පරිහරනය කිරීම අලසව නින්දට

බරනොවී කළමනා සියළු කාර්යයන් ඉටු කිරීම දෙදෙනාට එක පණ මෙන් ආත්මයෙන් ආත්මයට එකතු වී අන්තිම ආත්මය දක්වාම ආවෙමි.

පිංවත් ස්ත්‍රී පුරුෂයින් මේ ලෝකයෙහි අඹු සැමියන් දෙදෙනා රෝද දෙකේ රථයක් සම සමව දෙදෙනාට දෙදේනා ගෞරවයෙන් විශ්වාසයෙන් ළඟ නොව දුර බැලීමෙන් වාසනාවන්ත පවුල් ජීවිතයක් ගෙන යායුතුයි. එය මෙලොව පරලොව යහපතටම හේතු වන්නේය. තම ස්වාමියාට අනාදර කලාවූ ස්ත්‍රීන් වෙනුවෙන්ම වෙන්වූ නිරයන්ට නොයන සුගතිගාමී වන්නටම කටයුතු කරන්න. තම ස්වාමියාට මවුපියන්ට මෙන් ආදර ගෞරවයෙන් ක්‍රියා කළාවූ ස්ත්‍රීන් සුගතිවලම උත්පත්ති ගන්නේය. තවද මේ ලෝකයේ පුරුෂයන්ට වධක භාර්යාවෝය - චෝරභාර්යාවෝ - ස්වාමිභාර්යාවෝය - මාතෘ භාර්යාවෝය - භගිනි භාර්යාවෝය - සකි භාර්යාවෝය - දසි භාර්යාවෝයයි සත් ආකාරයක භාර්යාවෝ සිටිත්.

එයින් වධක භාර්‍යා, චෝර භාර්‍යා අයිරා භාර්‍යා (ස්වාමි භාර්‍ය) ස්වාමියාට අහිත දක්වූ පාප ස්ත්‍රීන් තිදෙන සුභදශීලීව වාක්පරුෂයෙන් යෙදී පුරුෂයන්ට අනාදර කළාවූ මිත්‍ර ද්‍රෝහි සංඛ්‍යාත වූ අකුසල් බලයෙන් මරණින් පසු නිරයෙහි ඉපිද අති දීර්ඝකාලයක් දුක් විඳින්නේය. එනිසා මඟ හොඳට පෙනේ නම් සත්පුරුෂ ස්ත්‍රීන් විසින් පාපී ක්‍රියාවලින් වෙන්වී තම ස්වාමි පුරුෂයන් කෙරෙහිම පක්ෂපාතීව වෙසෙත්වා. මාතෘ භාර්යාව භගිනි භාර්යාව සකි භාර්යාව - දසිභාර්යාව යන කල්‍යාණ ස්ත්‍රීන් සතර දෙනා අසාධාරණ ආචාරශීලයෙන් හා පති පූජාවෙන් යෙදුනා වූ ගුණ බලයෙන් මම ජාතියෙන් මිය අපාය නොදක දෙව්ලොවම උත්පැත්තිය වන්නාහුය. රූප ශෝභාවෙන් සහ සියළු යස ඉසුරින් අග්‍රව මහේශාක්‍ය දෙවියන්ට අගමෙහෙසුන්ව ශ්‍රී සම්පත් විඳින්නාහ. එයින් මිදී මනුලොවට ආකල උසස් කුළ කාන්තාවන් වශයෙන් සැප සම්පත් විඳ නිවන් අවබෝධයද කරගන්නේය. පිංවත් ස්ත්‍රී පුරුෂයිනි මම වනාහි සසර

ඇවිදිනා කළ මගේ මේ ගෞතම නම් බුදුරජාණන්ට කිසිකලෙකත් වධක භාර්යා නොවෙමි චෝර භාර්යා නොවීමි ස්වාමි භාර්යා නොවීමි කෝටි ගණන් ආත්ම භවයේදී මාතෘ භාර්යාව උපන්නෙමි. භගිනි භාර්යාව උපන්නෙමි සකි භාර්යාව උපන්නෙමි දසි භාර්යාව උපන්නෙමි බුදුන්ගේ සියළු පාරමිතාවන්ට උපකාරවීමි. එම කුසල බලයෙන් මමද ඔබසේම අභව්‍ය ස්ථානාදී අකුශල භූමියක නුපන්නෙමි දිව්‍ය ලෝක - මනුලෝකවල බොහෝ කලක් සැප වින්දෙමි.

මෙසා දීර්ඝ කාලයක් මුළුල්ලෙහි වෙනත් ස්වාමියෙකු ප්‍රාර්ථනා නොකළෙමි. ස්වාමි දරුවෝ ද මා විනා අන්‍ය ස්ත්‍රියක ප්‍රාර්ථනා නොකළ සේක. ස්වාමි දරුවන් සමඟම මද්‍රිදේවී නම් අග බිසොව පාරමිතා සාගරයෙන් එතෙරවී ගොස් තුසිත දිව්‍ය ලෝකයෙහි ඔබ හා සමඟම සියළුම දිව්‍ය සම්පත් විඳ ඔබ හා සමඟම නැවත මනුලොව ඉපිද මහත් සැප සම්පත් විඳ ඔබ වෙනුවෙන්ම මහනව ජාති ජරා ව්‍යාධි මරණ නැත්තාවූ සැප ඇති නිවනම අවබෝධ කර ගතිමි. සත්වයින් ආකාශයෙහි බ්‍රහ්ම රූපයෙන් මේ ධර්ම දේශනාව කළාවූ මම දෙවියෙක් බ්‍රහ්මයෙක් නොව දඹදිව වසන කළ බිම්බා දේවීමය සිද්ධාර්ත කුමරුට අගමෙහෙසිය වූ යශෝධරා දේවියව මමය. රාහුල මාතාවෝද මමය. දස දහසක් සක්වල හඬගා කියා බුදු කෙනෙකුන් සේ ආකාශයෙහිම වැඩහිඳ බණ වදරා මුළු ලොවම විශ්මයට පත් කළේය.

ඒ වේලෙහි සියළුම සත්වයින්ට ඇති වුනාවූ සතුට එක හඬින් බුදුන් වහන්සේ කෙනෙකුට මෙන් සාදුකාර දුන්නේය. මෙසේ පෑවාවූ ඍධිබල මහිමය වර්තමාන සත්වයින් සිතින් දකිත් නම් නුවණින් අවබෝධ කරගනිත්නම් බුද්ධපතිව්‍රතතාවියකගේ සංසාරයෙහි තිබුණා වූ සාමී භක්තිය පාරමිතාවන් සපුරාදුන්නා වූ අයුරු අවබෝධ කරගතහොත් සතර අපායත් හිස්වන්නේය. දිව්‍ය බ්‍රහ්මලෝක පිරෙන්නේය. නිවන් පුරයටම

පත්වන්නේය. සංසාර සාගරයෙන් නොගැලවෙන්නා නම් කවද සියළු ම ප්‍රාතිහාර්යන් නිමවා පූර්ණචන්ද්‍රයා අස්තයට යන ආකාරයට අහසින් බැස බුදුරජාණන් වහන්සේ වෙත වැඳ නමස්කාර කර අවනතව දෙහොත් මුදුන් දී සිට තුන්ලෝ සත්වයින්ගේ පෙම්බර පියාණෙනි මේසා පෙළහරක් දක්වූ මම වෙනත් දිව්‍ය බ්‍රහ්මයකුගේ උපදේශයකින් නොව ඔබ වහන්සේගේ උපදෙස් පරිද්දෙන්ම කළෙමි. මා පෑවා වූ පෙළහරෙහි කීවා වූ බණෙහි කිසියම් වරදක් වූයේ නම් එම වරදද ක්ෂමාකොට වදළ මැනව ස්වාමි දරුවන්ට සංසාරයෙහි පක්ෂපාතව අවුත් මේ මගේ අන්තිම දර්ශනයය. මේ ලෝකයෙහි මා බඳු වූ පිංවත් ස්ත්‍රී කෙනෙක් නැත. ඔබ වැනි බුදු කෙනෙකුන්ට සංසාරයෙහි මා කල පක්ෂපාතකම් පාරමිතාවන් සාදදුන් අයුරු මට පෙනේ නම් ඔබ වහන්සේට විශේෂයෙන්ම පෙනෙන්නේය. ස්වාමි දරුවන් හා මමද කෙලෙස් මුහුද පීනා සසරින් ගොඩනැගී සිටි හෙයින් මෙතැන්හි කීමෙන් පලයක් නැත.

එසේ වුවත් මෙතැනහි රැස්වූ සරාගිවූ පෂිදෙහි සැකහරනා නිසාත් බොහෝ ස්ත්‍රී ලෝකයාට අවවාදනියත් බුද්ධපතිව්‍රතතාන්ගේ ගුණ මහිම දක්වන නිසාත් මාකෙලෙන් කිසියම් පක්ෂපාතකමක් දක්නමි. දුන් මෙතුන්හි සිටම සංසාරය බලන්නා වූ මම සසර නොයෙක් ජාතියෙහි මාගේ ජීවිතය පුද ඔබගේ ජීවිතය ආරක්ෂා කර දුන් තැන් අසංඛ්‍ය ගණන් ජාති දකිමි. සසර නුඹ වහන්සේ රජකළ මම අගබිසව කළ වෙසතුරු ජාතියෙහි මෙන්ම යාචකයින් අවුත් මමමදන් ඉල්වූ කළ ඔබ වහන්සේ මා මුහුණ බැලූ කළ කිසිදෙම්නසක් නැතුව කොමාරික විතකිනාතුහනාතුවා - යි මා සිංහනාද කර ස්වාමිනි කැමැත්තක් හට මා දන්දී වදළ මැනවයි කී කල්හි එකෙනෙහිම මා අත අල්වා ගෙන මිහිකත හඬවා යාචකයින්ට දන් දුන් කල් ඔවුන් මාසලව සල්වාතු කල්හිද මා කිසි දෙම්නසක් නොවූ කල් නොයෙක් සතුන්ට ගොදුරු වූ නිසා මාම දුන්කල් අසංඛ ගණන් ජාති දකිමි. තවද නොයෙක් ආත්ම භාවයෙහි නුඹ වහන්සේගේ ජීවිත වෘත්තිය

නිසා මා විකුණා කඳ කලී මම අනුන්ට දරමිටි පැන්කල ආදිකල් බැළමෙහෙකල කල් එබඳු තැන් හිඳ නුඹ වහන්සේ කෙරෙහි මා සිහිනෙනුදු දෙම්නස් නොවූ කල් අසංඛ්‍ය ගණන් ජාති දකිමි තවද සසර නුඹ වහන්සේ නොයෙක් දණ්ඩනාදියෙන් හසුව මම උකස් කර පාවාදී ගැලවී ගිය කල් අසංඛ්‍ය ගණන් ජාති දකිමි.

තවද සසර නොයෙක් ජාතියෙහි නුඹ වහන්සේ හා මා එකමඟ ගමන් කරන අතර සිංහයින්, ව්‍යාග්‍රයින්, දිවියන්, වලසුන්, කිඹුලන්, යක්ෂ, රාක්ෂයින් ගොරව ගොරවා නුඹ වහන්සේ කරා ආ කල්හි දිව ගොස් නුඹ වහන්සේ පසුකොට උන්ගේ කටට පැන ගොදුරු වූ කල්හි නුඹ වහන්සේගේ දිවිරැක දුන් කල්හි මාගේ ජීවිතය ගැන නොසිතා ඔබ වහන්සේගේ ජීවිතයම රැක දුන්කල් අසංඛ්‍ය ගණන් ජාති දකිමි. එකල ඔබ වහන්සේ ද මාගේ ජීවිතය ආරක්ෂා කරදීම සඳහා ඔවුන්ට ගොදුරු වූ කල් අසංඛ්‍ය ගණන් ජාති දකිමි.

තවද සසර නුඹ වහන්සේ නොයෙක් වධ බන්දනයටවත් කල්හි එම වධ බන්දනයටවත් කල්හි එම වධ බන්දන මට පවරා නුඹ වහන්සේ බේරාගත් කල එම පක්ෂපාතක මෙහි පැහැදුණා වූ වධකයින් ලවා මමද ගලවා ගත්කල් මාගේ ගුණ බලෙන් අප දෙදෙනාම නිදහස් වුවාර අසංඛ්‍ය ගණන් ජාති දකිමි. තවද සසර නුඹ වහන්සේ මා හැර ගොස් පර ස්ත්‍රීන් කෙරෙහි ගොස් නොයෙක් වධ බන්දනයට පත් වූ කල්හි ඒ බව අසා කාම ක්‍රෝධයක් නැතුව පුතකු ගෙවිපතෙහි දයාබර මවක්සේ විලාප දී හඬ හඬා එතනට ගොස් මා සතු වස්ත්‍රාභරණ ඔවුන්ට දී ගලවා ගත් කල් මාතෘ භාර්යාව වූ කල් අසංඛ ගණන් ජාති දකිමි. තවද නුඹ වහන්සේ නිසා නුඹ වහන්සේම පතා හත්පලක් වස්ත්‍රාභරණ දක්වා පරිත්‍යාග කල කල් අසංඛ්‍ය ගණන් ජාති දකිමි. තවද සසර මා කුසින් වැදූ දරුවන් නුඹ වහන්සේ යාචකයින්ට පාවාදුන්කල් අසංඛ්‍ය ගණන් ජාති දකිමි. එම දරුවන්

දන්දෙන කල ඒ ඒ දික්හි දිවපියන් අතටහසුව නොවන කල්හි කිරිපොවා නලවන පසාරයෙන් දරුවන් අල්වාගෙන නුඹ වහන්සේට දරුවන් පාවාදීලු කල් ඒ දරුවන්ට මා දැඩිකම් කළ කල් නුඹ වහන්සේට මා කීකරු වූ අසංඛ්‍ය ගණන් ජාති දකිමි. නැවත නැවත දරුවන් වදදුන් කල් නුඹ වහන්සේ දම්සොඬව එම දරුවන්ද නැවත නැවත යාචකයින්ට දන්දෙන වේලෙන්ද මා ඔබ කෙරෙහි කිසි දෙම්නසක් නොමැතිවම අසංඛ්‍ය ගණන් ජාති ඔබ වහන්සේටම පක්ෂපාතීව සිටියෙමි. තවද දම්සොඬව මා පලන් පළඳනා පවා ගලවා දෙන කළ මා මේනස් නොවී සොම්නසින්ම සිටිකලත් අසංඛ්‍ය ගණන් ජාති දකිමි. තවද සසර සක්විති රාජ්‍ය හැර වනයට යන කළ මමද එක්වම ගොස් නුඹ වහන්සේට පන්සලින් බැහැරවයා නොදී පලවැළ වනමුල් මාගේ හිසින් ඇද ශීලපාරමිතාව මම ම සාද දුන් කල් අසංඛ්‍ය ගණන් ජාති දකිමි.

මේ ආදී කාරණයන් සසර මා කලාවූ පක්ෂපාතීකම් හා වින්ද වූ දුක් වේදනා වලින් මාගේ ඥණයට විශේෂයෙන් පෙනෙන කළ ඔබ වහන්සේටද එය මනාව පෙනේ. බුදු ඇසෙනුදු බලා වදළ මැනවයි සසර තමන් වහන්සේගේ පුරුදුකම් දක්වා නොයෙක් ජාති දක්නා නුවණ මහ පිරිසට හඟවා අභීත සිංහ ධේනුවක සේ බුදුරජාණන් වහන්සේ ඉදිරිපිට වැඩ සිටි අභීත සිංහනාද කළ සේක. තමන් වහන්සේගේ සසර පක්ෂපාතකම් සහ පුරුදුකමින් සිංහනාද කළ කල්හි සියළුම ජනයො එතණින් සාදුකාර දී මෙතරම් පුණ්‍ය මහිමයක් පැමට මෙතරම් ඇතට දිවැස් ලැබීමටත් බුදුරජාණන් වහන්සේ ඉදිරියේ සිංහනාද කරන්නටත් මෙම උත්තමාවිය පෙර මොනවිධියෙ කුශලකර්මයක් කරගෙන ද යන සැකය මතුවිය.

එවෙලෙ ස්වාමි දරුවෝ ජනයා සිතු සිතුවිල්ල ''යශෝධරා ස්ථවිරිනි තොප බුදුන්ට පක්ෂවීමට පූර්ව ප්‍රතීධය දක්වා තොපගේ පිරිසට උපන් සැකය තොපම දුරුකරව'' යි වදාළ සේක.

ඒවේලෙහි උන්වහන්සේ ස්වාමි දරුවො මාගේ පූර්ව පුනීධයද මා ලවාම කියවන අභිප්‍රාය ඇති සේක් වනැයි සිතා බුදුන් වැඳ සිට මහ සෙනඟ දිසාව බලා සත්වයෙනි මා ස්වල්ප වූ පිනක් කලාවූ ස්ත්‍රියක් යයි නොසිතව. මා බඳුවූ හේතු සම්පත් ඇති කෙනෙක් මේ බුධෝත්පාදයෙහි ඇතැයි නොසිතව. එයට හේතුවනම් අසූමහ ශ්‍රාවකයො කල්පලක්ෂයක් පෙරුම්පුරා ආහ. අගසවුවන් වහන්සේලා දෙනම එකාසංඛ්‍ය කල්ප ලක්ෂයක් පෙරුම්පුරා ආහ. මම වනාහි දුරානිධානයෙහි පටන් මෙම සාරාසංඛ්‍ය කල්පලක්ෂය මුළුල්ලෙහි ස්වාමි දරුවන් සමඟ පාරමිතා පුරා ආවෙමි. ඊට පළමු බ්‍රහ්මදේව නම් ගෞතම බුදුන් දැක ඔබ මනෝපූණීධි ලබන සමයෙහි ඔබ හා එක්වම ආවෙමි. ඔබ දීපන්කර පාදමූලෙහි වචීපුණ්ධි ලබන සමයෙහි ඔබ හා එක්වම ආවෙමි. ඔබ දීපන්කර පාදමූලෙහි වචීපුණ්ධි ලබන සමයෙහිදී මම වනාහී බමුණු මහසැල් කුළයෙහි සුමිත්‍රා නම් ධනමානවිකාව එ බුදුන් ගිහිගෙයි වසන කළ පදුමා නම් අගබිසවුන්ගේ අසුරියන් ගෙයි පහන් දැල්වීමක් අවශ්‍ය නොවන ශරීරප්‍රභා හා ඒ බුදුන් හා එක්වනුව උසභක්ඛන්ධ නම පුතණුවන් වහන්සේගේ වික්‍රම හා නොයෙක් පෙළහර දැක මමද එවැනි පිං ප්‍රාර්ථනා කර සියළු සැප සම්පත් හැර වනගතවී තපස් රකිමින් සුමිත්‍රා නම් පරිභාජිකාව ඔබ කෙරෙහි පෙම්බැඳු මහනෙල් මල් අට මිටක් ගෙන බුදුන් වඩින පෙරමඟට ගොස් **පස්සථ ඉමංතාපසං - ජටිලං උගගතාජනං අපරිචෙය්‍ය ඉතොතජපෙ - අයංබ්‍රධො හවිසසති** මුන් වහන්සේට එම බුදුන් නියත විවරණ දෙන වේලෙහි මමද වීරානුගතව විශ්වාසයෙන් ඔබ කෙරෙහි ආලයෙන් එම මල් අටකළඹින් පස්කළඹක් මුන්වහන්සේ නමට පුද තුන් කළඹක් මා නමට පුද මම මෙම වීරපුරුෂයාට සංසාරයෙහි

පක්ෂපාතවම වෙසේවායි පාරමිතාවන්ට අනුබල වේවායි එම බුදුන් මෙම විවරණ කථාවෙහි වදාළ යශෝධරා නම මටම වේවායි ඒ රාහුල පුත් රුවන මා කුසින්ම වද දෙම්වායි කියා ප්‍රාර්ථනා කළෙමි. එම බුදුරජාණන් වහන්සේ එකෙනෙහිම මටද විවරණ වදාළ සේක.

මමද එතැන් පටන් ඔබ හා සමාන නිධානයක් රක්ෂා කරන්නීයක ලෙස ඔබගේ පාරමිතා නිධානය රක්ෂා කොට දුන්නේය. තවද ඔබ කොණ්ඩඤ්ඤ නම් බුදුන් දක විජිතා නම් චක්‍රවර්ති රජව දිව්‍ය සමාන වෙහෙරකදී තුන් මසක් අසදෘෂ මහ දන්දී දෙවන විවරන පූජාවලත් මමද සුවාසූ දහසක් බිසෝවරුන් පිරිවරා එම දනය මා අතින්ම පිසදී මම මුන්වහන්සේම ප්‍රාර්ථනා කළෙමි. තවද මංගල නම් බුදුන් සමයෙහි ඒ බුදුන් දක සුරුචි නම් බ්‍රාහ්මණව දෙළොස් යොදුන් මණ්ඩපයෙහිදී බුදුපාමොක් රහතන්ට සත් දවසක් මුළුල්ලෙහි අසදෘෂ වූ චතුමධුර දනය දී තුන්වන විවරන පූජාව ලත් සමයෙහි මමද ඔබට ප්‍රජාපතී වූ බ්‍රාහ්මණ මහා සාරිකාව මාසිය අතින් එම දනය පිසදී මමද මුන්වහන්සේම ප්‍රාර්ථනා කළෙමි. සුමන නම් බුදුන් දක අතුල නම් දිව්‍ය රාජයා නම්ව සඳමඩුළුසා මඩුවකදී අසදෘෂ වූ දිව්‍ය දවය සත් දවසක් දී ඔබ බුදුබව පැතූ සතර වන විවරණ පූජාව සමයෙහි මමද ඔබටම අගමෙහෙසිකත් කෝටි ගණන් නිගාඩගනාවක් පිරිවරා කෙළ ගණන් කඩුපුල් මල් පිටින් පුද ඒ සෑදූ මුළුල්ලෙහි බුදුන් රහතන්ට දිව්‍යතෘතපාදියෙන් පුද මම ඔබ වහන්සේම පැතුවෙමි. තවද රේවත නම් බුදුන් දක අතිදේව නම් බ්‍රහ්මයාව උතුරුසලුවෙන් පුද දහසක් සොලොවෙන් ඒ බුදුන්ට ස්තුති ගී කියා බුදුවෙම්වායි පතා 5 වන විවරණ පූජාවලත් දවස් මමද ස්වාමි දරුවන්ට ප්‍රජාපතිව එම පුණ්‍යකර්මයට සමාදන්ව ඔබම ප්‍රාර්ථනා කළෙමි. සොභිත නම් බුදුන් දක සුජාතා නම් බමුණුව තුන්මසක් අසදෘෂ මහදන් දී හයවන විවරන පූජාවලත් සමයෙහි එම දනය මා අතින්ම පිසදී ඔබම ප්‍රාර්ථනා කළෙමි. අනෝමදස්සී බුදුන් දවස ඔබ මහේශාක්‍ය යක්ෂ

සේනාධිපතියෙක්ව නොයෙක් යක්ෂ සේනාවන් පිරිවරා ගොස් එම බුදුරජාණන් වහන්සේට සත් දවසක් දිව්‍ය දනය දී සත්වන විවරනය ලත් දවස්හි මමද අගමෙහෙසියක්ව දිව්‍යාංගනාව එම දනයට සමාදන් වී ඔබම ප්‍රාර්ථනා කළෙමි.

පදුම නම් බුදුරජාණන් දවස සිංහරාජව ඉපිද වනයෙහි ඇවිදින අතර එම බුදුරජාණන් වහන්සේ දැක සත් දවසක් අනිමිසලෝචන පූජා කොට ඔබ අටවන විවරනලත් දවස මම සිංහධේනුව ඔබ හා අනුවම සිට ඔබම ප්‍රාර්ථනා කළෙමි. තවද නාරද නම් බුදුන් දැක උග්‍රතාපසව සත් දිනක් සෘධි දනය දී ඔබ වහන්සේ නවවන විවරන පූජාවලත් දවස් මමද පරිබ්‍රාජිකාව එම පිං අනුමෝදන්ව ඔබම ප්‍රාර්ථනා කළෙමි. තවද පියුමතුරා බුදු සමයෙහි ජටිල නම් මහරැටිව මහදන්දී පසු ද බුදුපාමොක් මහ සඟනට සියළු පරිෂ්කාර දනය දී බුදුබව පතා මුන් වහන්සේ දසවන විවරන පූජාව ලත් දවස් මමද ප්‍රජාපතීව ඔබම ප්‍රාර්ථනා කළෙමි. තවද සුමේධ නම් බුදුරජාණන් වහන්සේ දැක උත්තර නම් මානවකව අසූකෙළක් ධනය බුදුන්ට පුද බුදුන් කෙරෙහි මහණව එකොළොස්වන විවරන පූජාව ලත් දවස්හි මමද ඔබ හා සමඟම මහණව ඔබම ප්‍රාථනා කොට සිළිරැක්කෙමි. තවද සුජාත නම් බුදුන් දැක චක්‍රවර්ති රජව සක්විති රජය පුද මහණව.

දෙළොස්වන පූජාව ලත් දවස් මමද සුවාසු දහසක් බිසෝවරුවන්ට අධිපති වූ ස්ත්‍රී රත්නව ඔබ හා සමඟම මහණව ඔබම ප්‍රාර්ථනා කොට සිල්රැක්කෙමි. තවද පියදස්සී නම් බුදුන් දැක කාශ්‍යප නම් ධනමානවකයා කෙළ ලක්ෂයක් ධනය වැයකොට සඞ්ඝාරාමයක් කරවා බුදුරජාණන් වහන්සේට පූජාකර තෙළෙස්වන විවරන පූජාවලත් දින මමද එම වෙහෙර පිළිගන්වා ඔබට පතිනියව එම පින සමාදන්ව ඔබම ප්‍රාර්ථනා කළේය. තවද අත්ථදස්සී බුදුන් ලොව පහළ වන සමයෙහි ඔබ සුසීම නම් මහ තවුස්ව පරසතු මදරා මල් පූජාවෙන් පුද තුදුස්වන විවරන පූජාව ලත්

දවස් මමද පරිබ්‍රාජිකාව එතනම සිට ඔබම ප්‍රාර්ථනා කළෙමි. තවද ඔබ ශක්‍රදේවේන්ද්‍රව ධම්ම දස්සී නම් බුදුන් පුද පසළොස්වන විවරන පූජාව ලත් දවස මමද අසූතුන් කෙළක් දෙවඟනන් අවුත් ඔබම ප්‍රාර්ථනා කළෙමි.

සිද්ධාර්ථ නම් බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූ දවස් හි මංගල නම් තවුස්ව ජම්බුපල දනයෙන් බුදුන් පුද සොළොස්වන විවරන පූජාලත් දිනයෙහි මමද පරිබ්‍රාජිකාව සිල් රක්ෂාකොට ඔබ වහන්සේම ප්‍රාර්ථනා කළෙමි. තවද ඔබ සුජාතා නම් මහ රජව රාජසම්පත්තයෙන් තිස්ස නම් බුදුරජාණන් වහන්සේ පුද පැවිදිව සතළොස්වන විවරන පූජාවලත් දින මමද අගමෙහෙසින්ව ඔබ සමගම මහණව ඔබම ප්‍රාර්ථනා කොට සිල් රැක්කෙමි. තවද විජිතාවී නම් රජව මුළු දඹදිවම රාජ්‍යයෙන් ඵුස්ස නම් බුදුරජාණන් වහන්සේ පුද අටළොස්වන විවරන පූජාවල් දවස්හි මමද ඔබ හා මහණව ඔබම පතා සිල්රැක්කෙමි. තවද ඔබ අතුල නම් දිව්‍ය නාගරාජව පණස් යොදුන් දිව්‍ය මණ්ඩලයෙහිදී සත් දිනක් මුළුල්ලෙහි දිව්‍ය දනයෙන් විපස්සී නම් බුදුන් පුද එකුන් විසිවන විවරන පූජාලත් දවස් මමද අගමෙහෙසීන්වූ නාගයඟනාව සුවහස් නාගකන්‍යාවන් පිරිවරා සත් දිනක් මුළුල්ලෙහි බුදුරජාණන් වහන්සේට උපහාර කර ඔබ වහන්සේම ප්‍රාර්ථනා කළෙමි. තවද අරින්දම නම් රජව මහත් වූ රාජ සෘධින් සිඛී නම් බුදුරජාණන් වහන්සේ පුද විසිවන විවරන පූජාවලත් දවසෙහි මමද අග මෙහෙසින්ව එම දනය පිසදී සිය අතින් බුදුන් සඟුන් වළඳවා මුන්වහන්සේම ප්‍රාර්ථනා කළෙමි. තවද සුදර්ශන නම්රජව රජ මහා විහාර දස දහසක් කරවා පිළිගන්වා වෙසසභූ නම් බුදුරජාණන් පුද රජය හැර විසිඑක්වන විවරන පූජාවලත් දවස්හි මමද අගමෙහෙසීන්ව එම දනය දෑතින්ම පූජා කරදී මහණව සිල්රක්ෂා කොට ඔබම ප්‍රාර්ථනා කළෙමි.

තවද මහා භද්‍රකල්පයෙහිදී පළමු වරට ලොව පහළවූ කකුසඳ නම් බුදුන් දවස ඛෙම නම් නරපති රාජ්‍ය දනයෙන් එම බුදුරජාණන් වහන්සේ

පුද, මමද අගමෙහෙසීන්ව එතුන්හිම මහණව සිල් රක්ෂාකොට ඔබම පැතුවෙමි.

තවද මෙම කල්පයෙහි දෙවෙනිව සම්මාසම්බුද්ධත්වයට පත් වූ කෝනාගම නම් බුදුරජාණන් වහන්සේ ප්‍රධාන සඟරුවනට පර්වත නම් නරේන්ද්‍රව තුන්මාසයක් අසදෘෂ මහා දන්දී තෙවිසි විවරන පූජාවලත් දවස මමද අගමෙහෙසීන්ව එම දනය සංවිධානය කොට ඔබ වහන්සේම ප්‍රාර්තනා කළෙමි. තවද ජෝතිපාල නම් බ්‍රහ්මණව ධන පමණින් කාශ්‍යප නම් බුදුන් පුද මහණව සුවිසිවන විවරන පූජාව ලද්දවස් මමද බ්‍රාහ්මණ මනවිකාව ඔබ හා සමඟම මහනව අවුරුදු විසිදහක් සිල්රැක ඔබම ප්‍රාර්ථනා කළෙමි.

එසේ හෙයින් සියළුම ලෝක සත්වයින් මවිසින් එසේ මෙසේ පිනක් කර ගත් තැනැත්තියක නොවෙමි. මේ මගේ බුදුරජාණන් වහන්සේ යම් යම් බුදුරජාණන් වහන්සේලා දැක යම් යම් පුණ්‍යකර්මයන් රැස්කරගත්තද මමද ඔබ හා සමග ඒ වහන්සේලා දැක යම් යම් පුණ්‍යකර්මයන් රැස්කරගත්තද මමද ඔබ හා සමග ඒ ඒ බුදුරජාණන් වහන්සේලා දැක වැඳ වෙන වෙනම ප්‍රාර්ථනා කර ගතිමි. එසේ හෙයින් සසර ඔබටම පක්ෂපාතව සිටියෙමි. පාරමිතා ලතාව මල්පල ගන්වා දුන්නෙමි. දැන් මෙම අන්තිම ජාතියෙහිදී ද ඔබටම අගමෙහෙසින්ව යශෝධරා නමින් දිව්‍ය සමාන මනුෂ්‍ය සැප සම්පත් විඳ දැන් ඔබගේ ශාසනයෙහි වැද මහනව අමාමහ නිවන් දුටිමි. සංසාර දුක් සාගරයෙන් එතෙරවීමට පෙර මම ඔබට අනුබල වීමි. දැන් ඔබ මට අනුබල වූ සේක. අසාධාරණ වූ සෘධි ලදමි. විශේෂ වූ දිවකත් ලදමි. නිර්මල වූ දිවැස් ලදිමි. පරසිත් දන්නා නුවණ ලදිමි. යනාදියෙන් සිංහනාද කොට තමන් වහන්සේගේ පූර්ව ප්‍රණිධි සංඛ්‍යාත වූ නොයෙක් සෘධිපල දැක් වූ සේක.

මෙසේ උන්වහන්සේ තමන් වහන්සේගේ පූර්ව ප්‍රණිධි බුදුරජාණන් වහන්සේගේ පෙරටම වැඩ සිට සිංහනාද කළ කල්හි සිසාරා සිටි මනුෂ්‍ය, දිව්‍ය, බ්‍රහ්ම, එක පැහැර දෙහොත් මුදුන් දී මහත් වූ සාදුකාරයෙන් තුන්ලොව. පුරා පූජා කළේය. සියළුම ස්ත්‍රී වර්ගයා එබඳු ගුණසම්පත් - ආචාර සම්පත් - හේතු සම්පත් - ප්‍රඥා සම්පත් - ඍධි සම්පත් - නිවන් සම්පත් ප්‍රාර්ථනා කළාය. මෙසේ උන් වහන්සේ මෙලොව විෂ්මයට පත්කර බුදුන් වැඳ ක්ෂමා කරවා අවසර ඉල්වා වදළ කල්හි ස්වාමි දරුවෝද උන්වහන්සේගේ වික්‍රම මුළු ලොව වැස්සෝ දත් බව දැන මෙවිට අවසර දුන මැනවයි සිතා

**අඤ්ඤ නෙතා නාම මංකඛඛං - කිංහවෙ ගුන හුසනෙ**

**කිවුතතරං තෙව කඛාමි - නිබබනාය වජනනි යා යි**

යන මෙම ගාථාවෙන් ''යශෝධරා ස්ථවිරිනි චතුරාර්ය සත්‍යයන් අවබෝධය කළා වූ තොප වැනි අමාමහා නිවනින් දුටුවන් ඔවුනොවුන් ලා ක්ෂමා කරවීමෙහිලා එල නැත. තොප තබා මුළු ලෝ වාසීන් නිවන් පුරයටම මෙහෙවන්නා වූ මම දැන් ඒ පුරයට අවසර ඉල්ලන්නා වූ තොපට කුමක් නම් කියම් ද තොප සිතුයෙ කාරණමය බුදුන්ගේ පරිනිර්වාණය තොප වැනියන් නුදුටු මනාමය, මෙයින් නික්මෙන්නාහ. තොප වැනියන් මා වැනියන් ක්ෂමා කරවීමෙහිලා එල නැතත්, ලෝක ව්‍යවහාර නිසා ක්ෂමා කලම්හයි'' තුන්යළක් වදරා ශ්‍රී මුඛයෙන් නිකුත් සුවඳ ගඳින් මුළු ලොව සුවඳ කරඬුවක් සේ කරවමින් නික්මෙවයි අවසර දී වදළ සේක. ඒ වෙලෙහි උන් වහන්සේ නැවත නැවත බුදුන් වැඳ තුන්වාරයක් ප්‍රදක්ෂිණා කොට දසදහසක් මෙහෙණින් සෙනග හා සමඟ අවසර ගෙන නික්ම

බුදුරජාණන් වහන්සේගේ දර්ශනයට විෂය තාක් තැන් බුදුරජාණන් වහන්සේට අභිමුඛව පසුබැස ගොස් බුද්ධ දර්ශනය මුවහ වන තැන්හි සිට නැවත පසඟ පිහිටුවා වැඳ බුදුන් වන දෙසම බල බලා උදර වූ ආදරයෙන් තමන් වහන්සේගේ මෙහෙනවර බලා හික්මුණු සේක.

එවෙලෙහි ශ්‍රාවකයන් වහන්සේ ද බුදුරජාණන් වහන්සේගේ අදහස් දැන විහාරෝපචාරය දක්වා ස්ථවිරිනි පසුපස ගමන් පූජා කළ සේක. උන් වහන්සේ නියාවද දෙව්බඹුන් පූජා කළ නියාවද බුදුරජාණන් වහන්සේ ද ශ්‍රාවක සේනාව හා දෙව්මිනිස් සේනාව පිරිවරා තුන්යම රෑ වැඩසිට ඔබගේ ආදහන පූජාව කළ නියාවද එනුවර වැසියන් ලවා ඔබගේ ධාතු වඩා යශෝධරා නම් මහසෑය බැඳ වූ නියාවද එහි දවස් පතා නොයෙක් පූජා කරන සේ ව්‍යවසත්කාර වූ නියාවද සියළු සත්වයින් එම සෑය නිසාම පින් රැස් කර දෙව්පුර නිවන් පුර පැමිණියාවද බුදුරජාණන් වහන්සේ රජගහ නුවරින් නැවත සැවැත්නුවර වැඩි නියාවද මෙසේ තමන් වහන්සේට සසර පක්ෂපාතව විසූ ස්ත්‍රීන් අතින් පවා මෙබඳු වූ ප්‍රාතිහාර්යය - ප්‍රතිපත්ති ආදී අනේකප්‍රකාර වූ පූජා ලත් හෙයින් එසේ වූ පූජා විඳීමට සුදු වූ හෙයිනුත් අපගේ බුදු පියාණන් වහන්සේ අරහත් නම් වනසේක.

මේ පූජාවලියෙහි අප බුදුරජාණන් වහන්සේ යශෝධරා මහ ස්ථවිරින්ගෙන් ලද ප්‍රතිපත්ති පූජා කථා නම් වූ එක්තිස්වන පරිච්ඡේදයයි.

**පූජා විසෙසං සහ පච්ච යෙහි**
**යසමා අයං අරහති ලොකනාථො**
**අත්ථා නු රූපං අරහංති ලොකෙ**
**තසමා ජිනො අරහති නාම මෙතං - යි**

පිංවත්නි,

මේ ආරම්භයේ සිටම බුද්ධ ගරුත්වයෙන් යශෝධරා ස්ථවිරින් වහන්සේ ගැන තමාගේ මෑණියන්ට තිබෙන ගෞරවයෙන් කියැවුවානම් සිතට ලොකු අවබෝධයක් සංසාරය ගැන දුකක් බියක් අනිත්‍ය, දුක්ඛ, අනාත්ම භාවයන් මෙම බුද්ධ ශාසනයෙහි ලොවට පහළ වූ බුදුරජාණන් වහන්සේත් බුදුරජාණන් වහන්සේට පමණක් දෙවැනි වන යශෝධරා මහ ස්ථවිරින් වහන්සේ අනන්ත සසර නිමක් නැති කාලාන්තරයක් මුළුල්ලෙහි නිමක් නැති ආත්ම භාවයන් හිදී සතර අපා නිරයන්හි නොව මනුෂ්‍ය ආත්ම යන්හිදී පමණක් විඳ තිබෙන්නා වූ අසීමිත දුක් වේදනා සිත් එසේ නම් තවමත් සසර දුක් විඳින අප ගැන කවර කතාද? එම නිසා පිංවතුන් මෙය ආදර්ශයට ගෙන ජීවිත ආලෝකමත් කරගෙන සතර අපා අටමහා නිරයන් දිව්‍ය බ්‍රහ්ම ලෝකවල අපට මවෙක්, පියෙක්, සහෝදර, සහෝදරියන් හෝ වෙනත් ඥාති මිත්‍රාදියෙක් නොවුන එකම සත්වයෙකුදු නැත. එම නිසා අද මෙතැන් පටන් සසර දුකින් මිදී නිවනින් සැනසීමට තිබෙන්නා වූ නිවන සඳහා සියළුම සත්වයින්ට මෛත්‍රී කර මළකුණු අනුභවයෙන් වැලකී දස පුණ්‍ය ක්‍රියාවල යෙදී ස්වර්ග සම්පත් ලබා මෙම කප අවසානයට බුදුවන බුදුරජාණන් වහන්සේ දැක නිවන් ලබා ගැනීමට තිබෙන මාර්ගයෙ ගමන් කරන්න.

මෙම මාහැඟි ධර්ම ග්‍රන්ථය මුලින්ම මුද්‍රණය කර ප්‍රසිද්ධ කරනු ලැබුයෙ ක්‍රිස්තුවර්ෂ 2007 ජූලි 29 වන මාගෙ හැත්තෑවන උපන්දිනය සමරා දැනට අතුරුගිරියෙ පදිංචි රාජගිරියෙ හේවාවිතාරණ විද්‍යාලයේ ගුරුතුමිය වූ රමණී කාරියවසම් මහත්මිය ප්‍රධාන පිරිසකගේ දායකත්වය උඩයි. 4 වන වරටද එතුමියගෙ අනුග්‍රහයෙන් පිටපත් ප්‍රමාණයක් මුද්‍රණය

කර මාවෙත ලබා දෙන ලදී. මෙපින් බලෙන් සසර වසනා තුරු නිවන් දක්නා ජාති දක්වාම ධර්මාවබෝධය ලැබීමටත් ඒම බලෙන් කිසිම භවයක සතර අපායොත්පත්තියකට, මිත්‍යාදෘෂ්ඨි භාවයකට නොවැටෙන ඉතා අගනා පුණ්‍යකර්මයකි. මෙය නැවත මුද්‍රණය කරනු ලබන්නේ 2015 අප්‍රේල් මාසයේ 6 වන වරටය.

මීට මෙතැති
**පූජ්‍ය අකුරේගොඩ රතනසාර හිමි**
ලුම්බිණි සේනාසනය,
කොස්වත්ත,
බත්තරමුල්ල.

04-03-2015

# මස් රසයෙන් වියැළී යන මානව දයාව

ලෝකයේ ධනය උපයන වැඩිදෙනා මස් සඳහා සතුන් ඝාතනය කරන්නන් බව පෙනී යයි. ආදියේදී මිනිසාට සතුරු සතුන් මරා දැමූහ. ආහාරය සඳහාත් මැරූහ. ඒ කැළයට ගොසින්ය. නවීනයේ ගොවිපොළ ලෙයින් ගොඩ දිය සතුන් ඇතිකර මරා කති. මේ නිසා මිනිසා මිනිසා මැරීමටද පසුබට නොවෙති. සිත දරුණුවීම නිසාය ඒ. බොහෝ විට ගොවිපොළේ සතුන් මරන්නේ ගොවිපොළ අයිතිකරුවාමය. සතුන් මැරීමට මධ්‍යසාරය පානය කිරීමද අවශ්‍යය. සතුන් මරන්නා පස් පවම කරති.

බුදුදහමට අනුව සත්ව ඝාතනය හෝ හිංසාව නින්දිත ක්‍රියාවෙකි. මහ ඝන වනයේ වුවද විවිධ සතුන් එකමුතුව ජීවත්වෙති. උන්ට තම තමන් රැකදෙන ස්වාභාවික ක්‍රම ලැබී ඇත. එහෙත් මසා ආහාරයට ගන්නා සතාට අනෙක් සතා ගොදුරු වෙති. මිනිසාද මුලදී මාංශභක්ෂක සතෙකි. එහෙත් වර්තමාන මනුෂ්‍යයා පැරැණි අයට වඩා දැනුමෙන් වැඩිය. එබැවින් මස් මාලු නැතිව ස්වභාවික ආහාර ගත හැකිය.

සමහරු ''මස් පදම්වීමට'ය කියා පණ පිටින්ම කෑ ගස්සවා පොලුවලින් පහරදී මරති. ඌරන් මැරීමට අද අපේ රටේ අයද විදුලි රැහැන් අටවා තමන්ම මැරෙති. ලක්ෂ ගණනින් වී කුරුල්ලෝ මරති. රිලා වඳුරන්ට වධ දී මරති. මී මැස්සෝ පුළුස්සති. මාළුන්ට වස දී මරා ගනිති. ගවයා පණපිටින්ම කපති. සතුන්ට පමණක් නොව මිනිසුන්ද අමු අමුවේ මරා සිනාසෙති. සතුන් මරා පුරුදු මිනිසාට මිනිසුන් මැරීම අරුමයක් නොවේ. සත්ව ඝාතකයාගේ ශරීර අංග ලක්ෂණ කුරිරු ලෙස පිහිටයි. පව් පිරීමට සතුන් මරාලීමේ දක්ෂතාවයක්ද පිහිටයි. නිකරුණේ පවා සතුන් මැරීමට පෙළඹෙති. මෙවැනි සත්ව ඝාතකයන්ට හදිසි විපත් වැඩිය. ආයුෂ ද කෙටිය.

අද සමාජයේ වැඩි දෙනෙකුට මසින් හා මතින් තොරව ආහාර ගත නොහැකිය. ඒ ලෙස පුරුදු වී තිබේ. මෙය පිරිහීමේ ලක්ෂණයකි. රූපවාහිනී වැඩසටහන්වලින් ද වැඩිපුර පෙන්වන්නේ සතෙකුට තවත් ගොදුරු වන ආකාරයේ දර්ශනයන්ය. අහිංසක සතෙකු කුරුල්ලෙකු දුටු විට පාසල් ළමුන් පවා ගලකින් මුගුරකින් ගසා සතුටු වීමට පුරුදු වී ඇත. සත්හට මෙත් වැඩීමට අද පුරුදු කිරීම අපහසුය. සතුන්ට උන්ගේ පාඩුවේ ඉන්නට ඉඩදීමට පුරු කළ යුතුය. සතුන් හා මිනිසුන් මරන්නේ ද මුදල් ඉපයීමට. දුප්පත්කම තුරන් වුණොත් දඬයම නතර වේද? එහෙත් ධනවතුන්ම සතුන් මරන - මරවන බව පෙනී යන්නකි.

අලපලාදෙණියේ

**සුමනදාස සිරිවර්ධන** විසිනි.

# ගවයා මෙතරම් පාපී ඇයි ?

| | |
|---|---|
| ලොව පළමුවෙන් ගවයකු මැරූ පුවත | දූක |
| හැඩුවලු සුර - බඹුන් ඉවසිය නොහැකි | දුක |
| අදමෝ දහස් ගණනින් බෙලි කපන | එක |
| දෙවි උදහසට ලක් නූනොත් පුදුම | යෙක |
| | |
| මව නැති අහිංසකයන් ජීවත් | වන්නේ |
| ගව දෙන නිසා බව ටික දෙනෙකිය | දන්නේ |
| ඒ ගව අම්මා මරමින් ඇගෙ මස් | කන්නේ |
| අනුකම්පාව ලෙහි බිඳුවක් නැති | යෙන්-නෙ |
| | |
| ගොනු පිට අදින්නට බැරි බර පට | වන්නේ |
| අදිනට නොහැකි තැන කෙටිටෙන් බැට | දෙන්නේ |
| වයසට දුබලවූ විට මැරුමට | දෙන්නේ |
| මිනිහා තුළ මිනිස් ගතිගුණ නැති | යෙන්-නෙ |
| | |
| පැටියා සිටියදී කුසගිනි දරනු | බැරි |
| දෙනගෙන පැහැර ගයි පැටියට එරුණ | කිරි |
| තෙද බල තිනෙත් දෙවිඳුනි මනුලොවට | හැරී |
| නිදහස ගවයගේ දුන මැන කොහොම | හරි |
| | |
| ගැල් ඇද ගව් ගණන් මග ගිරි දිදුළු | දිගේ |
| ගොවිතැන් වලදි සිට හොඳ හිතවතෙකු | වගේ |
| පස්ගෝ රසින් රසකළ රට - දූයට | මගේ |
| පෙර ගොවියා දනි ගව සම්පතක | අගේ |
| | |
| ගොවිතැන් සරුකරයි ලේ කිරි කර | දිපී |
| බර ඇද හරි හම්බකර සිත් සන | සාපී |
| අසරණ දුබලවූ විට මස් ටික | කාපී |
| ගවයා අනේ ඇයි මේ තරමට | පාපී |

සෝමලතා ජයවර්ධන

බුදුසරණ 27.09.1994



මුද්‍රණය : තිරසවි ප්‍රින්ටර්ස් 0112 569192, 077 9620359